**ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුව**
--------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**
----------------

**1.1 තත්ත්වාගණය කළ මතය**
----------------------------

ශ්‍රී ලංකා රේගුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/ 2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
---------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- ශ්‍රී ලංකා රේගුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන් දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) මෙම වාර්තාවේ 1.6.3 (අ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත් එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ තැන්පතු ගිණුම් පිළිබඳ තොරතුරු ආකෘති පත්‍ර අංක ඒසීඒ 4 මගින් එක් එක් තැන්පතු ගිණුම්හි සිදුවූ ගනුදෙනුවල සාරාංශ ගත තොරතුරු දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව වෙන වෙනම ඉදිරිපත් කළ යුතු විය. එහෙත් එම නියමයන්ට පටහැනිව ශ්‍රී ලංකා රේගුව විසින් ඉදිරිපත් කර තිබූ ඒසීඒ 4 ආකෘතිය භාණ්ඩාගාර මුද්‍රිතවල සඳහන් තොරතුරු පමණක් පදනම් කර ගෙන සකස් කර තිබුණු අතර ඒ හේතුවෙන් දෙපාර්තමේන්තු පොත් අනුව පවත්නා ශේෂයන් පිළිබඳ තොරතුරු වාර්තා නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වාර්ෂිකව නිකුත් කරනු ලබන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ACA 4 ආකෘතියේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය ලෙස විශේෂයෙන් සඳහන් කර නොමැති බැවින් එහි භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ශේෂය දක්වා ඇත. 2020 වර්ෂයේ සිට ACA 4 ආකෘතියේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය ලෙස දැක්වීමට සටහන් කරගෙන ඇත. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුවෙහි ආදායම් සංකේත අංක 1003.07.16 යටතේ වාහන හිමිකම් බද්ද මගින් අපේක්ෂිත ආදායම රු.2,200,000,000 ක් ලෙස දක්වා තිබුණු අතර සත්‍ය ආදායම ලෙස රු.1,357,955,586 ක් එකතු කර තිබුණි. එය ශ්‍රී ලංකා රේගුවේ ශීර්ෂ 247 යටතේ ගිණුම්වල දැක්වීම වෙනුවට වෙනත් ශීර්ෂ ආදායමක් ලෙස දක්වා තිබුණි. තවද ඇස්තමේන්තුව හා සත්‍ය ආදායම අතර වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණි. | පනත් හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව ආදායම් සංකේත හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. | විගණන නිරීක්ෂණය නිවැරදිය. 2019.04.30 චක්‍රලේඛය මගින් මෙම ආදායම් සංකේතය පවරා තිබුණද, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් මෙම ආදායම රේගු දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ 247 යටතට මාරු නොකිරීම නිසා ශීර්ෂ 247 මාසික ගිණුම් සාරාංශ පදනම් කර ගනිමින් අවසාන ගිණුමට අගයන් එක් කිරීම තුලින් මෙම මහ හැරීම සිදුව ඇත. එය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් නිවැරදි කරවා 2020 වර්ෂයේ ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කිරීමට සටහන් කොට ගෙන ඇත. |

| | | |
|---|---|---|
| | | මෙම විචලතාවයට හේතුව වනුයේ වාහන ආනයන ප්‍රමාණය අඩු වීමයි වාහන හිමිකම් මත බද්ද අදාල වනුයේ තීරුබදු ලේඛනයේ සංයෝජිත වර්ගීකරණ මාතෘකා අංක 8701, 8703, 8704, හා 8711 යටතේය. වාහන හිමිකම් මත බද්ද තීරණය වනුයේ වාහන ආනයනය කරන ප්‍රමාණය මත වන අතර (වාහනයක් සඳහා රු.2000), එය 52%ක අඩු වීමකි. ඉහත වර්ගීකරණ අංකයන්ට අදාලව අඩු වී ඇත. ඇස්තමේන්තුව සමග සැසදීමේ දී මෙය තවදුරටත් පැහැදිලි වේ. |

**1.6.3 විගණන සාක්ෂි නොවීම**

--------------------------

පහත සඳහන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2473 දෙනෙකු සඳහා වැටුප්, වේතන, අතිකාල, නිවාඩු දින වැටුප් හා දිරිදීමනා වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් රු.1,795,330,536 ක් ද රේගු අතිකාල නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා තොරතුරු තාක්ෂණ සන්නිවේදන අරමුදල මගින් රු.1,087,341,531 ක්ද වශයෙන් එකතුව රු.2,882,672,067 ක් වූ වියදම සම්බන්ධයෙන් තහවුරු කිරීමේ සාක්ෂියක් වශයෙන් සේවයට වාර්තා කල බව සනාථ කෙරෙන ඇඟිලි සළකුණු වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. | (i) රජයේ පොදු විධාන හා රාජ්‍ය ගිණුම් කාරක සභා නියෝග පිලිපැදීම පැහැර හැරීම නොකල යුතු බව.<br>(ii) මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කිරීම.<br>(iii) සේවක කළමනාකරණය හා අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම. | ඇඟිලි සලකුණු යන්ත්‍ර මිල දී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති අතර එම යන්ත්‍ර සවිකිරීම සඳහා මැනුම් කටයුතු කර ඇත. ඒ අනුව, ඉදිරියේ දී මෙම ගැටළුව නිරාකරණය කර ගත හැකි වන බව නිරීක්ෂණය කරමි. |
| (ආ) 2004 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ නියමිත බදුගෙවා බැංකු ඇපකර නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබූ අවස්ථා 16 ක් පමණ පැවති බවට වාර්තා වුවද එම කාලපරිච්ඡේදය තුළ බැංකු ඇපකර මත භාණ්ඩ නිදහස් කර ගැනීමට ලියාපදිංචි වූ සංඛ්‍යාව හා නිදහස් කර ගැනීමට කටයුතු කළ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | මේ සම්බන්ධයෙන් තොරතුරු කඩිනමින් විගණනය වෙත වාර්තා කිරීම හා විගණන පනතේ විධිවිධාන කෙරේ අවධානය යොමු කිරීම. | මේ ගැන විමසා බැලීමේදී තහවුරු වූයේ පැරණි කාර්යාල පරිශ්‍රයේ සිට නව කාර්යාල ගොඩනැගිල්ල වෙත භාණ්ඩ ප්‍රවාහනයෙන් පසු අදාල ලේඛනය හෝ ලිපිගොනු පිළිබඳ තොරතුරු නොමැති බවය. ඒ පිළිබඳව සොයා බැලීමට සටහන් කර ගතිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 වර්ෂය තුළ විදෙස් ගත ශ්‍රී ලාංකිකයන් 4059 දෙනෙකු විසින් ලක්සිරි සේවා ආයතනය හරහා මගීන් කැටුව නොඑන ගමන් මළු (UPB) සේවා පහසුකම ලබාගෙන තිබුණු අතර තවත් මගීන් 8240 දෙනෙකු ත්‍යාග (Gift) සේවා පහසුකම ද ලබාගෙන තිබුණි. එහිදී ශ්‍රී ලංකා රේගුව විසින් රුස්කර තිබූ ආදායම පිළිවෙලින් රු.17,625,020 ක් හා රු.31,840,355 ක් විය. එහෙත් මගීන් කැටුව නොඑන ගමන් මළු (UPB) හා ත්‍යාග (Gift) ලෙස එවනු ලබන මෙම භාණ්ඩවල වටිනාකම තහවුරු කිරීම සඳහා විකුණුම් ඉන්වොයිසි හෝ වෙනත් කිසිදු ලියවිල්ලක් ඉදිරිපත් වී තිබුණු බවට සාක්ෂි නොවීය. භාණ්ඩවල රේගු වටිනාකම නිර්ණය සඳහා දෙපාර්තමේන්තු නියෝග (DOPL) 790 ප්‍රකාරවද කටයුතු නොකර රේගු නිලධාරීන්ගේ අභිමතය පරිදි භාණ්ඩ තක්සේරු කිරීම් සිදුකර තිබුණි. මේ හේතුවෙන් සත්‍ය වශයෙන් ලැබිය යුතු ආදායම් ලැබී ඇතිද යන්න තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | දෙපාර්තමේන්තු නියෝග 790 ප්‍රකාරව කටයුතු කිරීම.<br><br>DOPL – 790 අනුකූලව කටයුතු කල බවට වාර්තා තබා ගැනීම හා ඒවා විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. | UPB හෝ ත්‍යාග ලෙස එවනු ලබන භාණ්ඩ විදෙස්ගත මගීන් පුද්ගලික පරිහරණය වෙනුවෙන් රැගෙන එන අතර බොහෝ විට ඒවා පාවිච්චි කළ හෝ එසේ නොවන භාණ්ඩ වන අතර එම භාණ්ඩ සඳහා ඔවුන් සතුව විකුණුම් ඉන්වොයිසි හෝ වෙනත් ලියකියවිලි නොමැත. එම භාණ්ඩ පරීක්ෂාකර වටිනාකම් තක්සේරු කිරීම හෝ වර්ගීකරණය කිරීම වසර 08 ක පමණ සේවා කාලයක අත්දැකීම් ඇති සහකාර ගාස්තු නිලධාරීන් විසින් සහ වසර 25 ක් හෝ ඊට අධික සේවා අත්දැකීම් මෙන්ම තක්සේරු රාජකාරී අත්දැකීම් ඇති රේගු අධිකාරීවරුන්ගේ අධීක්ෂණය හා සුපරීක්ෂණය යටතේ සිදුකෙරේ. එමෙන්ම නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයෙකුගේද සුපරීක්ෂාව යටතේ සිදු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඈ) | ලක්සිරි සේවා මධ්‍යස්ථානය (UPB Warehouse) හරහා මෙරටට එවා තිබූ ගමන් මළු/ භාණ්ඩ අතුරින් නියමිත බදු නොගෙවීම හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා ඉටු නොකිරීම හේතුවෙන් තාවකාලිකව නිදහස් නොකර තිබුණ භාණ්ඩ පසුව නැවත නිදහස් කිරීමේදී අදාල අවශ්‍යතාවය පූර්ණ කළ බවට දැක්වෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | දෙපාර්තමේන්තු නියෝග 790 ප්‍රකාරව කටයුතු කිරීම. නිසි කාර්යපරිපාටිය අනුගමනය කල බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීම. | 2020.02.01 දින සිට එම භාණ්ඩ නිදහස් කිරීමට අදාළ සහතිකවල අංක ලේඛනයේ සටහන් කිරීමට කටයුතු යොදා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඉ) | 2019 ජනවාරි සිට මැයි මාසය දක්වා රැන්ක් බහාළුම් අංගනය (RCT) වෙත බහාලුම් 49,910 ක් ලැබී තිබෙන අතර ඉන් බහාලුම් 44,305 ක් අංගනයෙන් පිටතදී (Out Panel) පරීක්ෂා කර තිබුණි. බහාලුම් 5,605 ක් RCT අංගනය තුළදී ස්කෑන් පරීක්ෂාව සිදු කර තිබුණි. අංගනයෙන් පිටතදී පරීක්ෂා කර තිබූ බහාලුම් 44,305 ක් රේගු අඥා පනත හා දෙපාර්තමේන්තු නියෝග (DOPL) | දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාරව කටයුතු කිරීම, නිසි කාර්යපරිපාටි අනුගමනය කල බව වාර්තා තබා ගැනීම හා ඒවා ඉල්ලූ විට ඉදිරිපත් කිරීම. | සියලුම බහාලුම් පරීක්ෂා කිරීම සිදු කළ නොහැක. අදාල අංගනය වෙත බහාලුම් එක්වර නොපැමිණෙන අතර ඒවා වරින්වර අංගනයන් වෙත ගෙන එයි. පිටත පරීක්ෂා කිරීම (Out Panel) සඳහා අවසරය ලබාදී ඇත්තේ ආනයනකරුගේ අතීත තොරතුරු, ආනයනය කරන භාණ්ඩවල ස්වභාවය |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාරව පරීක්ෂා කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවුණි. | | හා අවදානම් කළමනාකරණ ඒකකයේ (Risk Management Unit) අවදානම පාලනය කිරීමේ ක්‍රමවේදයට අනුකූලවය. මෙම බහාලුම්වලින් කොටසක් RCT අංගනය ඇතුලේදී පරීක්ෂා කිරීමට යොමු කෙරේ. එම පරීක්ෂණ සහතිකය මත ඉතිරි බහාලුම් ප්‍රමාණය පිටත පරීක්ෂාවට (Out Panel) මුදා හැරේ. විශේෂයෙන් අනෙකුත් ආයතනවල සහතික කිරීමට අවශ්‍ය විට පුද්ගලික ඇපකර මත මෙම බහාලුම් පිටත පරීක්ෂාවට නිදහස් කෙරේ. බාහිර පරීක්ෂාවේදී සියලුම බහාලුම් එකවර පරීක්ෂා නොකරන අතර තෝරාගත් අහඹු බහාලුම් ප්‍රමාණයක් පමණක් පරීක්ෂා කරනු ලැබේ. |
| (ඊ) | 2019 වර්ෂය තුළදී ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශය විසින් ටෙන්ඩර් කැඳවීම මගින් විකිණීමට ඉදිරිපත් කර තිබූ භාණ්ඩවල වටිනාකම තක්සේරු කළ ආකාරය දැක්වෙන ලිඛිත සාක්ෂි කිසිවක් අදාල අංශය තුළ නොවිණි. ඒ අනුව අදාල බදු මුදල් නිවැරදිව ගණනය කර ඇති ද යන්න පරීක්ෂා කළ නොහැකි විය. | දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාරව කටයුතු කිරීම, නිසි කාර්යපරිපාටි අනුගමනය කල බව වාර්තා තබා ගැනීම හා ඒවා ඉල්ලූ විට ඉදිරිපත් කිරීම. | ටෙන්ඩර් මගින් විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල වටිනාකම තීරණය කිරීම එම කාලය තුළදී අදාල භාණ්ඩවල වෙළඳපල වටිනාකම සහ අන්තර්ජාලය පිරික්සීමේදී එම භාණ්ඩවල වටිනාකම සැලකිල්ලට ගනිමින් සිදු කර ඇත. ඇතැම්විට අදාල භාණ්ඩ සඳහා ආසන්නම කාලයේ ඉදිරිපත් කර ඇති රේගු සටහන්කර ආසිකුඩා දත්ත ගබඩාවෙන් පරීක්ෂා කර අදාල අගයන් භාණ්ඩවල වටිනාකම තීරණය කිරීම සඳහා සැලකිල්ලට ගෙන තිබේ. |
| (උ) | 2015 ජනවාරි 01 සිට 2019 ජුනි 30 දක්වා වූ වසර 04 ½ ක් වූ කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා රේගුවේ රේගු විමර්ශන තුළින් රු.33,845,962,239 ක් වූ සමස්ත ආදායමක් රැස්කර තිබුණි. එහෙත් මීට ඇතුළත් දණ්ඩන ආදායම, විකුණුම් | ගිණුම් කටයුතුභාවය පරීක්ෂා කළ හැකි පරිදි වාර්තා, ලේඛන නිසි පරිදි නඩත්තු කිරීම. | ECCR තොරතුරු පද්ධතිය සම්බන්ධව ඔබගේ නිරීක්ෂණ පිළිබඳව අවධානය යොමු කරන ලද අතර මේ පිළිබඳව අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සම්බන්ධව අදාල අංශ |

| | | |
|---|---|---|
| ආදායම, රාජසන්තක කිරීමේ ආදායම හෝ තීරු බදු හා අනෙකුත් ආදායම් තීරණය කිරීමට පාදක කරගන්නා වූ භාණ්ඩවල වටිනාකම, එම වටිනාකම් තීරණය කළ ආකාරය හා අහිමි වූ තීරු බදු ආදායම යනාදිය තහවුරු කර ගැනීමට අදාල සාක්ෂි ශ්‍රී ලංකා රේගුවේ කිසිදු අංශයකින් විගණනයට ඉදිරිපත් නොවුණි. | | දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඌ) මුදල් රෙගුලාසි 272 (3) ප්‍රකාරව එකතුව රු.2,725,768 ක් වූ ගෙවීම් වවුචර් 28 ක් 2020 ජුනි 16 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 272 (3) අනුව කටයුතු කිරීම. | ගෙවීම් කටයුතු නිම නොවීම හේතුවෙන් මෙම වවුචර් විගණනය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. |

### 1.6.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වේ. තවද එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් අංශයට අදාළව මු.රෙ. 135 යටතේ බලතල පැවරීම, ගනුදෙනුවල නිළධාරීන් කිහිපදෙනෙකු අතර වගකීම් පැවරෙන අයුරින් රාජකාරී පැවරීම වැනි මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබයි. කෙසේ වුවද ඉදිරියේදී විගණන පනතේ ප්‍රතිපාදන අනුව කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත. |

### 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | | රු. | | | |
| (අ) | 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ශ්‍රී ලංකා | 5,103,000 | ලක්සිරි හා ට්‍රයිකෝ සේවා මධ්‍යස්ථාන විසින් පවත්වාගෙන යන | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත | ලක්සිරි සේවා මධ්‍යස්ථානය මගින් පෑලියගොඩ ශාඛාවට |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි (ඊ) උපලේඛනය | | බන්ධිත ගුදම්වල රාජකාරියෙහි යෙදවීම පිණිස ශ්‍රී ලංකා රේගුව විසින් ස්ථිර කාර්යමණ්ඩලය නිලධාරීන් 31 ක් හා කෘත්‍යාගත කාර්යමණ්ඩලය නිලධාරීන් 12 ක් අනුයුක්ත කර තිබුණද, කෘත්‍යාගත නිලධාරීන් 12 දෙනෙකු සේවයේ යෙදවීම වෙනුවෙන් අයවිය යුතු අතිකාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගාස්තු අයකිරීම. | අමතරව නින්දවූර් පිහිටි ශාඛාව මගින්ද භාණ්ඩ නිෂ්කාශන කිරීම සිදුකරනු ලබයි. එම නිශ්කාශන කටයුතු සඳහා වූ අනුයුක්ත කරනු ලබන්නේ පැලියගොඩ ශාඛාවේ කාර්ය මණ්ඩලය වේ. සම්පූර්ණ නිත්‍ය කාර්ය මණ්ඩලය 16 ක් වුවද භාණ්ඩ පරීක්ෂා කිරීම සිදු කරනු ලබන්නේ එම කාර්ය මණ්ඩලයේ සිටින සහකාර ගාස්තු නිලධාරීන් 07 දෙනාවේ. ඔවුන් දින 03 ක් නින්දවුරු පිහිටි ශාඛාවේ සේවය සඳහාද අනුයුක්ත කරනු ලැබේ. එබැවින් කෘත්‍යාගත කාර්ය මණ්ඩලය සේවය යෙදවීම සිදු කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** ----------------------- | | | | |
| (i) XIV පරිච්ඡේදයේ 1.1 සහ 4 වන වගන්ති | 159,600 | ස්වකීය රාජකාරී ඉටු කිරීම සඳහා ගමන් බිමන් යාමට නියමිත නිලධාරියෙකුට එහි දක්වා ඇති විධිවිධානවලට අනුව ගමන් වියදම් ද, ස්වකීය කාර්ය ස්ථානයෙන් රාජකාරී සඳහා පිටවී සිටින කාලය වෙනුවෙන් යැපීම් සහ නවාතැන් පිළිබඳ සංයුක්ත වියදම් පියවා ගැනීමට දීමනාවක් ද ගෙවිය යුතු වේ. එහෙත් ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් සඳහා උක්ත වගන්තිවලට පටහැනිව රාජකාරී ගමන් බිමන් සිදු කළ අවස්ථා 06 කදී ඔවුන්ගේ වියදම් පියවා ගැනීම සඳහා තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී | ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන වලට පටහැනිව ගෙවීම් සිදු නොකිරීම හා ගෙවා ඇති මුදල් නැවත අය කිරීම. | ශ්‍රී ලංකා රේගුවේ වැල්වැටිතුරේ සහ හම්බන්තොට රේගු කාර්යාලයන්හි විවිධ කටයුතු පරීක්ෂා කිරීම සඳහා නිලධාරීන් කිහිපදෙනෙකු සහභාගී විය යුතු අවස්ථාවන්හිදී අත්තිකාරම් මුදල් ලබාගෙන අදාල වියදම් දරා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | තිබුණි. | | |
| (ii) XXVIII පරිච්ඡේදයේ 1.3 ඡේදය | - | කටුනායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පැමිණීමේ පර්යන්තයේ අනුයුක්ත කර ඇති රේගු කාර්යමණ්ඩලයට අයත් නිලධාරීන් සඳහා පවත්වාගෙන යන පැමිණීමේ ලේඛන 06 ක් නිතිපතා මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක් වී නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXVIII ප්‍රකාරව කටයුතු කිරීම. | මගී සේවා (කටුනායක) අංශයේ පවත්වාගෙන යනු ලබන පැමිණීම හා පිටවීම සටහන්කරනු ලබන ලේඛනය විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර එය රේගු අධ්‍යක්ෂ (මගී සේවා) හා නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ විසින් අධීක්ෂණය කරනු ලබයි. |
| (iii) XXIV පරිච්ඡේදයේ 04 වන ඡේදය | 3,925,507 | (i) වර්ෂ 01 ට අඩු රු. 2,858,634 ක්, වර්ෂ 2 ත් 3 ත් අතර රු. (1,600) ක්, වර්ෂ 4 ත් 5 ත් අතර රු. 5,685 ක් හා වර්ෂ 05 ට වැඩි රු. 1,062,789 ක් වන විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV ප්‍රකාරව කටයුතු කිරීම. | වර්ෂ 01ට අඩු ණය ශේෂ හිමි නිලධාරීන්ගේ විශ්‍රාම ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම අවසන් වී නොතිබිණි. කෙසේ වුවද 2020.06.29 දින වනවිට එම ණය ශේෂයන්ගෙන් රු.1,038,029.08ක් අය කර ගෙන ඇත.<br><br>වර්ෂ 02ත් 03ත් අතර වූ රු. 1,600 ක් 2020 වර්ෂය තුළ ගෙවා නිම කිරීමට කටයුතු කරමි. |
| | 1,587,019 | (ii) වැඩ තහනම් කරන ලද නිලධාරීන්ගේ ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මින් වර්ෂ 03 ත් 04 ත් අතර රු. 68,800 ක්ද, වර්ෂ 04 ත් 05 ත් අතර රු.106,220 ක්ද, වර්ෂ 05 ට වැඩි රු. 1,411,999 ක්ද වූ ණය ශේෂයන් පැවතිණි. | ආයතන සංග්‍රහයේ XXIV ප්‍රකාරව කටයුතු කිරීම. | වර්ෂ 05 ට වැඩි නිලධාරීන් කොටසේ අදාළ විස්තර සොයා ගැනීමට උත්සාහ කළද ඇතැම් පුද්ගලික ලිපිගොනු පවා සොයා ගැනීමට නොහැකි වී ඇත. ඇතැම් ණය ශේෂ වර්ෂ 25කටත් වඩා පැරණි බැවින් විස්තර සොයා ගැනීම ඉතාමත් දුෂ්කර වී ඇත.<br><br>වැඩ තහනම් කරන ලද නිලධාරීන්ගේ තොරතුරු සොයා ගැනීම දුෂ්කර වී ඇත. |

(ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

**----------------------**

| | | | | |
|---|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 755 | - | ලක්සිරි සේවා මධ්‍යස්ථානය, ට්‍රයිකෝ සේවා මධ්‍යස්ථානය (UPB Warehouses) හා කටුනායක ගුවන් බඩු නිෂ්කාශන මධ්‍යස්ථානය (Air Cargo) ට අනුයුක්ත කර ඇති රේගු නිලධාරීන් ලිත් වර්ෂයක් තුළ කිහිපවරක් මාරුවීම් සිදු වී තිබුණද, භාණ්ඩ සුරක්ෂිතාගාර භාරව ඇති නිලධාරීන් එසේ මාරුවීම් සිදු වන අවස්ථාවලදී ලිඛිත භාණ්ඩ භාරදීම් හා භාරගැනීම් සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 755 ප්‍රකාරව කටයුතු කිරීම | ලක්සිරි හා ට්‍රයිකෝ සේවා මධ්‍යස්ථාන සඳහා පිළිතුරු ලබා දී නොමැත. කටුනායක ගුවන්බඩු නිශ්කාෂන මධ්‍යස්ථානයේ පිළිතුර අනුව එක් නිලධාරියෙකු අනුප්‍රාප්තික නිලධාරියාට වගකීම් පැවරීමේදි භාණ්ඩ පරික්ෂාවෙන් අනතුරුව වගකීම් ලබාගත් නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගැනීමට නොහැකි වී ඇත. ඉදිරියේදී මුදල් රෙගුලාසි 755 ප්‍රකාරව කටයුතු කෙරෙනු ඇත. |
| (ii) 2015 ජුලි 14 දිනැති අංක 3/2015 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) | (i) 1,508,000 | යම් විශේෂිත කාර්යයක් සඳහා ලබාදිය හැකි තත්කාර්ය අතුරු අග්‍රිමයෙහි උපරිමය රු.100,000 ක් ලෙස දක්වා ඇත. එහෙත් ශ්‍රී ලංකා රේගුව උක්ත “කිසියම් විශේෂිත කාරණයක් උදෙසා” යන්න නිවැරදි නොවන ලෙස අර්ථකතනය කර ගනිමින් එකම කාර්යය සඳහා උපරිමය ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිමයන් නිකුත් කර තිබුණි. එහිදී එක් නිලධාරියෙකුට වඩා වැඩි නිලධාරීන් සංඛ්‍යාවක් වෙත අත්තිකාරම් නිකුත් කර ඇතැයි යන සැකය විගණනයේදී බැහැර කල නොහැකි විය. ඒ අනුව 2019 වර්ෂය තුළ එසේ ගණන්දීමේ නිලධාරීගේ | චක්‍රලේඛයට පටහැනිව මුදල් ගෙවීම අනුමත කළ, නිර්දේශ කළ හා ලබාගත් නිලධාරීන් සම්බන්ධව විධිමත් පියවර ගැනීම. | විගණන නිරීක්ෂණ නිවැරදිය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii)1,000,000 | නිර්දේශය හෝ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පූර්ව අවසරයකින් තොරව රු.1,508,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | චක්‍රලේඛයට පටහැනිව මුදල් ගෙවීම අනුමත කළ, නිර්දේශ කළ හා ලබාගත් නිලධාරීන් සම්බන්ධව විධිමත් පියවර ගැනීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| | | තත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 සීමාව ඉක්මවන අවස්ථාවලදී ඒ සඳහා ප්‍රමාණවත් කරුණු සමඟින් ගණන්දීමේ නිලධාරීන්ගේ නිර්දේශය සහිත ඉල්ලීමක් මගින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පූර්ව අවසරය ලබාගත යුතුය. එහෙත් ඊට පටහැනිව 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රේගුව සතු වාහන සඳහා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් සමූපකාර සමිති හා පෞද්ගලික අංශය වෙත රු.1,000,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිමය නිකුත් කර තිබුණි. | | |
| | (iii) 549,854 | නිලධාරීන් 17 දෙනෙකු විසින් රු.1,290,000 ක් තත්කාර්ය අතුරු අග්‍රිම ලෙස ලබාගෙන එයින් ඉතිරිවී තිබූ මුදල් වැඩ කරන දින 04 සිට දින 227 දක්වා කාලයක් අත රඳවාගෙන තිබුණි. | අදාල නිලධාරීන් සම්බන්ධව විධිමත් පියවර ගැනීම. | විගණන නිරීක්ෂණ නිවැරදිය. |
| (iii) 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) | 2,700,827 | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල නිශ්චිත කාර්ය අවසන් කර දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමය ගිණුම් අංශය වෙත නැවත පියවිය යුතු බව සඳහන් කර තිබුණ ද, තත්කාර්ය අග්‍රිමයක් ලබාගන්නා ලද නිලධාරීන් විසින් අවස්ථා 25 කදී අතුරු අග්‍රිම නියමිත කාලය තුළ | අදාල නිලධාරීන් සම්බන්ධව විධිමත් පියවර ගැනීම | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | නිරවුල් කර නොතිබුණි. එම ප්‍රමාද කාලය දින 25 සිට දින 234 ක් දක්වා කාල පරාසයක් වූ බවද නිරීක්ෂණය විය. | | |
| (ඈ) | **ජාතික අයවැය චක්‍රලේඛ** | | | | |
| | මුදල් රෙගුලාසි 485 (4) හා 2004 ඔක්තෝබර් 01 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1:1:6 හා 1:1:7 ඡේද | 114,126 | නිලධාරියෙකු ස්ථාන මාරු වී ගොස් මාස 03 ක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ නොතිබීමට වගබලා ගත යුතු වුවද වර්ෂ 05 කට අධික කාලයක් ගත වී තිබුණ ද නිරවුල් නොවූ ණය ශේෂ පැවතුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම. | මෙම ණය ශේෂය රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙන් ඉවත් කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු සිදු කිරීමට හා 2020 වර්ෂයට පිළියෙල කරනු ලබන ගිණුමෙහි අදාළ ගැලපුම් සටහන් කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | 2010 මැයි 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF 443 | 500,000 | විවිධ සේවා සමුපකාර සමිතිවල කාරක ප්‍රාග්ධන ගැටළු අවම කර ගැනීමට විසඳුමක් ලෙස රාජ්‍ය ආයතනවල ඉන්ධන අවශ්‍යතා ලබා ගැනීමේදී සමුපකාර සමිති සතු ඉන්ධන පිරවුම්හල්වලට ප්‍රමුඛතාවය ලබා දිය යුතු බව දක්වා තිබුණද, මීට පටහැනිව ශ්‍රී ලංකා රේගුව විසින් පෞද්ගලික පිරවුම්හල්වලින් ඉන්ධන ලබා ගැනීම පිණිස, තැන්පතු ලෙස තැබීමට රු.500,000 ක මුදලක් තත්කාර්ය අතුරු අග්‍රිම මගින් ලබා දී තිබුණි. | චක්‍රලේඛයට පටහැනිව කටයුතු කළ පාර්ශවවලට ආයතන සංග්‍රහය පරිදි පියවර ගැනීම. | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ රේගු දෙපාර්තමේන්තුව වෙත ලබාගත් වෑන් රථ 07 ක් සඳහා ඉන්ධන ලෙස සුපිරි ඩීසල් යෙදිය යුතු බව දැනුම් දී ඇති අතර, MARKFED සතු ඉන්ධන හල්වල සුපිරි ඩීසල් නොමැති බැවින් C.F. De Mel & Sons ආයතනය මගින් ඉන්ධන ලබා ගැනීම සිදු කර ඇත. ශ්‍රී ලංකා රේගුවේ වංචාකාරී කටයුත්තක් හේතුවෙන් MARKFED ආයතනය ඉන්ධන ලබාදීම අත්හිටුවීමෙන් අනතුරුව C.F. De Mel & Sons ආයතනයෙන් ඉන්ධන සපයා ගැනීමට තැන්පතු මුදල රු.500,000 දක්වා වැඩි කිරීමට කටයුතු කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | **රේගු දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛ (DOPL)** | | | | |
| | (i) අංක 790 (DOPL) (02) ඡේදය | 605,796,308 | 2019 ජනවාරි 01 සිට 2019 නොවැම්බර් 30 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ, කටුනායක බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපල පැමිණීමේ පර්යන්තය හරහා ගුවන් මගීන් රැගෙන විත් තිබූ රේගු තක්සේරු වටිනාකම රු.605,796,308 ක් වූ භාණ්ඩවලට අදාල සාක්ෂි කිසිවක් නොවීය. තවද වටිනාකම තහවුරු කිරීම සඳහා රේගු අභ්‍යන්තර චක්‍රලේඛ අංක 790 (02) වගන්තිය ප්‍රකාර අවම වශයෙන් ඉදිරිපත් කළ යුතුව පැවති එකී භාණ්ඩවලට අදාල මිලදී ගැනීමේ කුවිතාන්සි, විකුණුම් ඉන්වොයිස් භාණ්ඩ පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛන හෝ විදේශ විනිමය ප්‍රේෂණය කිරීමට අදාල තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකරුණි. | අදාල තොරතුරු නිවැරදිව ලබා ගැනීම සහ පවත්වා ගැනීම සිදුකළ යුතු වීම. | මිල තීරණය කිරීමට තක්සේරු අංශයේ භාණ්ඩ වටිනාකම පිළිබඳ දත්ත පද්ධතිය පදනම් කර ගනු ලබන අතර ප්‍රධාන සහකාර ශාස්තෘ නිලධාරීන් වෙත පැවරී ඇති බලතල අනුව එම කටයුතු සිදු කරනු ලබයි. |
| | (ii) අංක 790 (DOPL) (04) ඡේදය | - | කටුනායක බණ්ඩාරණායක ජාත්‍යාන්තර ගුවන්තොටුපලෙහි පැමිණීමේ පර්යන්තය හරහා මගීන් රැගෙන එන වාණිජ ස්වරූපයේ භාණ්ඩවල වටිනාකම තීරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ තක්සේරු අංශය විසින් නඩත්තු කරනු ලබන භාණ්ඩවල වටිනාකම පිළිබඳව දත්ත පද්ධතිය පදනම් කර | අදාල තොරතුරු නිවැරදිව ලබා ගැනීම සහ පවත්වා ගැනීම සිදුකළ යුතු වීම. | මිල තීරණය කිරීමට තක්සේරු අංශයේ භාණ්ඩ වටිනාකම පිළිබඳ දත්ත පද්ධතිය පදනම් කර ගනු ලබන අතර ප්‍රධාන සහකාර ශාස්තෘ නිලධාරීන් වෙත පැවරී ඇති බලතල අනුව එම කටයුතු සිදු කරනු ලබයි. |

නොගෙන රේගු නිලධාරීන් තම අභිමතය පරිදි වටිනාකම තීරණය කර තිබුණු අවස්ථා විය.

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **ආදායම් කළමනාකරණය**

**2.1.1** **හිඟහිටි ආදායම් රැස්කිරීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු වටිනාකම රු.22,933,854,691 ක් වූ අතර ඉන් සියයට 28 ක් හෙවත් රු.6,370,798,202 ක් ආනයනික හිඟ බදු වලින් ද සියයට 26 ක් හෙවත් රු.6,044,842,097 ක් හිඟ ඛණිජ තෙල් නිෂ්පාදන බදුවලින්ද, සියයට 20 ක් හෙවත් රු.4,488,152,878 ක් හිඟ විශේෂ වෙළඳ භාණ්ඩ බදුවලින්ද, සියයට 13 ක් හෙවත් රු.2,870,623,881 ක් හිඟ වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදුවලින්ද, සියයට 7 ක් හෙවත් රු.1,716,039,908 ක් හිඟ ආනයන සෙස් බදුවලින්ද, හා සියයට 6 ක් හෙවත් රු.1,314,930,120 ක් හිඟ මෝටර්රථ නිෂ්පාදන බදු ආදායම්වලින් සමන්විත වී ඇත. | රජයට ලැබිය යුතු ආදායම් ප්‍රමාදයකින් තොරව රැස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | නිරීක්ෂණ සමග එකඟ වෙමි. |
| (ආ) | සමස්ථ හිඟ බදු ආදායමින් සියයට 62 ක් හෙවත් රු.14,330,919,797 ක් සමාලෝචිත වර්ෂයේ හිඟ බදු වටිනාකම නියෝජනය වන අතර සියයට 38 ක් හෙවත් රු.8,602,934,893 ඉකුත් වර්ෂ 19 ක කාලයක සිට හිඟ හිටි ශේෂ වන බව ද නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 128 හා රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2015 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කිරීම | නිරීක්ෂණ සමග එකඟ වෙමි. අදාළ ආයතන වෙත දන්වා ඉහත හිඟ බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | සමස්ථ බදු ආදායමින් සියයට 26 ක් හෙවත් රු.6,044,842,097 ක් 2019 වර්ෂයට අදාලව ඛණිජ තෙල් නිෂ්පාදන බදු ආදායම ලෙස පැවති අතර ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් බදු නොගෙවා නිදහස් කරගෙන තිබූ ඉන්ධනවලට අදාලව හිඟ හිටි ශේෂයන් වේ. | මුදල් රෙගුලාසි 128 හා රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2015 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කිරීම | නිරීක්ෂණ සමග එකඟ වෙමි. අදාළ ආයතන වෙත දන්වා ඉහත හිඟ බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඈ) | දඩ මුදල් හා රාජසන්තක කිරීම් ආදායම් යටතේ 2019 දෙසැම්බර් 31 දිනට හිඟ හිටව පැවති රු.1,630,549,991 ක ශේෂය විගණකාධිපති වෙත ඉදිරිපත් කළ හිඟ ආදායම් වාර්තාව තුළ ඇතුළත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 128 හා රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2015 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කිරීම | දඩ මුදල් හා රාජසන්තක කිරීම් ලෙස ආදායම් ශීර්ෂයක් හෝ ලැබීම් ශීර්ෂයක් නොමැත. මෙහි දක්වා ඇති ශේෂය හඳුනාගැනීමට නොහැක. |

| | | | |
|---|---|---|---|
| | | | විස්තර ලබා දෙන්නේ නම් පැහැදිලි කිරීම් සිදු කළ හැකිය. |
| (ඉ) | 2015 ජුලි 20 දිනැතිව භාණ්ඩාගාර ලේකම්වරයා නිකුත් කර තිබූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු කිරීම, රැස් කිරීම හා වාර්තා කිරීම මෙන්ම හිඟ ආදායම් රැස් කිරීම හා වාර්තා කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 128 හා රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2015 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කිරීම | පිළිතුරු ලබාදී නොමැත. |

## 2.1.2 ආදායම් එකතු කිරීම

----------------------

සමාලෝචිත වර්ෂයේදී ආදායම් සංකේත 13 කට අදාලව ඇස්තමේන්තු කර තිබූ මුළු ආදායම රු.862,815,000,000 ක් වුවද වර්ෂය තුළ රැස් කර තිබූ ශුද්ධ ආදායම, ඇස්තමේන්තු ගත ආදායමෙන් සියයට 72 ක් එනම් රු. 619,458,070,988 කි. අපේක්ෂිත ආදායම් මට්ටම ළඟා කර ගත නොහැකි වූ ආදායම් සංකේතවලට අදාල විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **ආදායම් ලැබීම්**<br>සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු, ආනයන සෙස් බදු, අපනයනය සෙස් බදු, විශේෂ වෙළඳ භාණ්ඩ බදු, ඛණිජ තෙල් නිෂ්පාදන බදු, මෝටර් වාහන නිෂ්පාදන බදු, අනෙකුත් නිෂ්පාදන බදු හා ඇගළුම් සඳහා දේශීය විකුණුම් මත ගාස්තු ආදායම් වශයෙන් එකතු කර තිබූ ආදායම් පසුගිය වර්ෂය හා සැසඳීමේදී එකතුව රු.91,654,835,591 කින් අඩු වී තිබුණි. | රජයේ ප්‍රධාන ආදායම් එකතු කරන්නෙකු ලෙස වඩාත් ප්‍රශස්ථ ලෙස ප්‍රමාණාත්මක වර්ධනයක් ලැබෙන පරිදි කටයුතු කිරීම. | ඔබගේ නිරීක්ෂණ නිවැරදි වන අතර එම කරුණු සමඟ එකඟ වෙමි. |
| (ආ) | 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් දඩ මුදල් හා රාජසන්තක කිරීම් ආදායම් සංකේත යටතේ රු. 3,379,832,212 ක ආදායමක් රැස්කර තිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආදායම රු.2,505,775,132 කින් හෙවත් සියයට 42.57 කින් අඩුවී තිබුණි. | නිසි පරිදි ආදායම එකතු කිරීමේ වර්ධනයක් ඇති වන පරිදි කටයුතු කිරීම. | -එම- |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2.2.1 පුනරාවර්ථන වියදම<br><br>(අ) මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු<br><br>සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්ථන හා මූලධන වියදම් වැය විෂය 11 ක මූලික ඇස්තමේන්තු හා සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර සියයට (71) සිට සියයට 632 දක්වා වූ පරාසයක විචලතාවයක් නිරීක්ෂණය වූ අතර මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>(i) වැය විෂයය අංක 1101 දේශීය ගමන් වියදම් සම්බන්ධයෙන් මූලික හා සංශෝධිත ඇස්තමේන්තු අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය විය. මේ සඳහා ඉදිරිපත් කල හේතු පිළිගත හැකි බවක් නිරීක්ෂණය නොවූ අතර ඇස්තමේන්තු සකස් කිරීමේදී විචක්ෂණශීලීව කටයුතු කර නොතිබුණි. | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කිරීම. | රේගු දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී දේශීය ගමන් වියදම් සඳහා (වැය විෂය අංක 1101 යටතේ) රු.42,000,000 ක ප්‍රමාණයක් අවශ්‍ය බව දන්වා යවා තිබුණ ද, ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් 2019 වර්ෂය සඳහා ද ලබා දී තිබුණේ 2018 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයම වන රු.37,500,000 කි. 2018 වර්ෂයට අදාළ ගෙවීම් වවුචර්වලින් කොටසක්ද 2019 වර්ෂය ආරම්භයේ දී ප්‍රතිපූරණය කිරීමට සිදු වූ බැවින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කර ගැනීමට සිදු විය. |

| | | |
|---|---|---|
| (ii) වැය විෂයය අංක 1203 ආහාර පාන හා නිල ඇඳුම් වියදම් සම්බන්ධයෙන් මූලික සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර සියයට 75 ක විචලනයක් නිරීක්ෂණය විය. එහෙත් 2019 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කරනු ලබන අවස්ථාව වන විට පැවැති මාසික ආහාර පාන වියදම් අනුව වාර්ෂික අවශ්‍යතාවය රු.මිලියන 33 ක් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු නොකර 2019 ප්‍රතිපාදන අවශ්‍යතාවය රු.මිලියන 20 ක් ලෙස භාණ්ඩාගාරය වෙත වාර්තා කර තිබුණි. | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කිරීම. | වැය විෂය අංක 1203 සඳහා මූලික ඇස්තමේන්තුව රු.මිලියන 40 ක් වන අතර, වර්ෂය තුළ ඇති වූ අවශ්‍යතාවයන් වෙනුවෙන් අමතර ප්‍රතිපාදන මාරු කර ගැනීමට සිදුවිය. |
| (iii) 2019 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශයන් සඳහන් කරමින් නිකුත් කර තිබූ 2018 ජූලි 17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 4/2018 මගින් කාර්යසාධනය පදනම් කරගත් අයවැයක් සකස් කිරීම අවධාරණය කර තිබුණ ද ශ්‍රී ලංකා රේගුව ඒ සම්න්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි. | චක්‍රලේඛවලට අනුගතව ඇස්තමේන්තු සකස් කිරීම. | මෙම දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම් මූලික වශයෙන් සාමාන්‍ය පරිපාලන වියදම් යටතට ගැනෙන හෙයින් පෙර වර්ෂයන්හි වියදම් රටාවන් හා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේ ලැබී ඇති තොරතුරු පදනම් කර ගෙන ඇස්තමේන්තු සකස් කර ඇත. කෙසේ වුවද අපේක්ෂිත පරිදි වියදම් දැරීමේ අවශ්‍යතාවයන් ඇති නොවීම නිසා විමසුමෙහි දක්වා ඇති පරිදි ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (iv) 2019 වර්ෂය තුලදී මු.රෙ. 66/69 වීරමොං ක්‍රියාපරිපාටි මගින් ප්‍රතිපාදන මාරු කර තිබුණු අතර ඒ හේතුවෙන් මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර විචලතාවය සියයට 70 ක සිට සියයට 632 ක විශාල පරාසයක විහිදෙන බව නිරීක්ෂණය විය. | විචක්ෂණ ලෙස ඇස්තමේන්තු සකස් කිරීම කළ යුතු වීම. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. විගණනය විසින් පෙන්වා දී ඇති අන්දමට හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීමට අදාළ නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| (ආ) ප්‍රතිපාදන ඉතිරිවීම<br>---------------------<br>සමාලෝචිත වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් වෙනුවෙන් රු.2,782,500,000 ක් වෙන්කර තිබූ අතර එයින් සියයට 6.85 ක් වූ රු.190,675,880 ක් වියදම් නොකර ඉතිරිව පැවතුණි. වැය විෂයයන් 09 ක ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 7 සිට සියයට 96 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණ බැව් නිරීක්ෂණය විය. | | |
| (i) ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන්ගේ විදේශ ගමන් වියදම් සඳහා වැය විෂයය අංක 1102 | විචක්ෂණ ලෙස | |

| | | |
|---|---|---|
| යටතේ රු.4,000,000 ක් වෙන් කර දී තිබුණද, වර්ෂය තුල වෙන් කල මුදලින් රු.149,100 ක් පමණක් වියදම් කර තිබුණි. ඒ අනුව ප්‍රතිපාදිත මුදලින් රු.3,850,900 ක් හෙවත් සියයට 96 ක් ඉතිරි වී තිබුණු අතර විදේශ ගමන් වියදම් රේගු කළමනාකරණ හා වන්දි අරමුදලින් දැරීම මෙම ඉතිරිවීමට හේතුවූ බව ගිණුමේ සඳහන් කර තිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීම කළ යුතු වීම. | රේගු නිළධාරීන්ගේ විදේශ ගමන් වියදම් රේගු කළමනාකරණ හා වන්දි අරමුදලෙන් දරනු ලබන අතර, රේගු නිළධාරීන් නොවන අනෙකුත් සේවාවන් හි නිළධාරීන්ගේ පුහුණු අවශ්‍යතාවයන් වෙනුවෙන් අපේක්ෂිත විදේශ ගමන් සඳහා මෙම මුදල ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වෙතත් එම නිළධාරීන් සඳහා අපේක්ෂිත පරිදි විදේශ පුහුණුවීම් නොලද බැවින් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. මේ වනවිට 2020 වාර්ෂික ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කර ඇති බැවින් 2021 වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේ දී විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |
| (ii) වැය විෂයය අංක 1203 ආහාර පාන හා නිල ඇඳුම් වෙනුවෙන් වාර්ෂික මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.70,000,000 කි. සමාලෝචිත වර්ෂය අවසානයේදී එම ප්‍රතිපාදිත මුදලින් රු.13,338,684 ක් හෙවත් සියයට 19 ක් ඉතිරිව පැවතුණි. අදාල වැය විෂයය යටතේ ප්‍රතිපාදන ඉතිරි වී තිබියදී ගෙවීම් සිදු නොකිරීම හා මෙම වටිනාකම් යථෝක්ත කාලපරිච්ඡේදයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය (සටහන් III) තුල සඳහන් කිරීමටද කටයුතු කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ඉදිරිපත් කිරීම සිදුකළ යුතු වීම. | 2019 වර්ෂය අග භාගයේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් සපයනු ලබන ආහාරවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් නිළධාරීන්ගේ පැමිණිලි ලැබෙමින් පැවති අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගෙවීම් කිරීමට නියමිතව තිබුණි. නමුත් ඒ සම්බන්ධයෙන් නිශ්චිත තීරණයකට එළඹීමට නොහැකි වූ බැවින් අදාළ මාස සඳහා ගෙවීම් කිරීමට නොහැකි විය. අතපසුවීමක් හේතුවෙන් මෙම වියදම් සම්බන්ධ තොරතුරු බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය (සටහන් iii) තුළ සඳහන් කිරීමට නොහැකි වී ඇති බව වැඩිදුරටත් දන්වමි. |

| | | |
|---|---|---|
| (iii) වැය විෂයය අංක 1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු වියදම් සමාලෝචිත වර්ෂයේදී රු.94,000,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ඉන් සියයට 70 ක් එනම් රු.65,524,584 ක් ප්‍රතිපාදන ඉතිරිවීම් වාර්තා කර තිබුණි. ඉතිරිවීම් සඳහා අපේක්ෂා කල පරිදි වියදම් ඇති නොවීම හේතු වූ බව සඳහන් කර තිබුණි. කෙසේ වෙතත් එම වැය විෂයය යටතේ ප්‍රවර්ථන වර්ෂය සඳහා රු.26,353,800 ක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට තවදුරටත් නිරවුල් කිරීමට පවතින බව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණි. ඒ අනුව තවදුරටත් බැරකම් නිරවුල් කිරීමට පැවතියදී අපේක්ෂිත පරිදි වියදම් ඇති නොවීම ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු වූ බව සඳහන් කර තිබුණි. | නිවැරදිව ගිණුම් ඉදිරිපත් කිරීම සිදුකළ යුතු වීම. | මෙම දෙපාර්තමේන්තුවේ පවතින ලිපිගොනු අනුව 2019 වර්ෂයේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවීමට හිඟ මුදලක් නොමැත. කටුනායක ගුවන්තොටුපල රේගු නිලධාරින්ගේ විවේකාගාරයේ ඉහළ මහල ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාගැනීම, එහි ව්‍යුහාත්මක වෙනසක් සිදුකිරීමට නැවත ඉංජිනේරු වාර්තාවක් ලබාගැනීමට සිදු වීම නිසා මෙය 2019 වර්ෂයේ දී ආරම්භ කිරීමට නොහැකි විය.<br><br>විගණන නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |
| (iv) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන පරිගණක පද්ධතිය වන ආසිකුඩා තොරුතුරු පද්ධතිය නඩත්තු කිරීම, පුනරුත්ථාපනය, වැඩි දියුණු කිරීම හා පුහුණු කටයුතු සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන අතරින් වැය විෂයය අංක 1302 යටතේ රු.1,327,575 ක්ද, වැය විෂයය අංක 2001 යටතේ රු.100,000,000 ක් වූ මුළු ප්‍රතිපාදිත මුදලමද, වැය විෂයය අංක 2002 යටතේ රු.24,814,248 ක්ද, වැය විෂයය අංක 2103 යටතේ රු.7,000,000 ක් වූ මුළු ප්‍රතිපාදිත මුදලමද, වැය විෂයය අංක 2401 යටතේ රු.10,000,000 ක් වූ මුළු ප්‍රතිපාදිත මුදලම ද ඉතිරි වී තිබුණි. එම ප්‍රමාණය වෙන් කරන ලද ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 44 ක්, 100ක්, 83ක් , 100 ක් හා 100 ක් විය. මෙම ඉතිරිවීම් සඳහා අපේක්ෂිත පරිදි වියදම් ඇති නොවීම හා රේගු කළමනාකරණ හා වන්දි අරමුදලින් වියදම් දැරීම හේතු වූ බව සඳහන් කර තිබුණි. | විචක්ෂණ ලෙස අයවැය ඇස්තමේන්තු සකස් කිරීම කළ යුතු වීම. | ශ්‍රී ලංකා රේගුවේ පරිගණක ජාල පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා 2001 වැය විෂයය යටතේ රු.මිලියන 100 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර තිබුණද, ඒ සම්බන්ධයෙන් වන තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා තාක්ෂණික දැනුම ඇති නිළධාරීන්ගේ කාර්ය බහුලතාවය හේතුවෙන් අදාළ පිරිවිතර හා ලංසු ලේඛන සකස් කිරීමේ ප්‍රමාදයක් සිදුවිය. ප්‍රසම්පාදන කටයුතු නිමකර ගැනීමට නොහැකිවීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව කාරුණිකව දන්වමි<br><br>විගණන නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |
| (v) වැය විෂයය අංක 1403 (විදුලිය හා ජලය) සඳහා රු.140,000,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ඉන් සියයට 11 ක් එනම් රු.15,990,572 ක් ප්‍රතිපාදන ඉතිරිවීම් ලෙස වාර්තා වී තිබුණි. මෙම ඉතිරිවීම් සඳහා | විචක්ෂණ ලෙස අයවැය ඇස්තමේන්තු සකස් කිරීම | වැය විෂයය අංක 1403 (විදුලිය හා ජලය) යටතේ ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා හේතුව ගෙවීම් සඳහා වන බිල්පත් 2019.12.31 දිනට ඉදිරිපත් නොවීම ලෙස සංශෝධනය විය යුතු බව |

| | | |
|---|---|---|
| අපේක්ෂා කල පරිදි වියදම් ඇති නොවීම හේතු වූ බව සඳහන් කර තිබුණද, එම වැය විෂය යටතේ ප්‍රවර්ථන වර්ෂය සඳහා රු.9,200,883 ක් තවදුරටත් නිරවුල් කිරීමට පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව වැය විෂයය යටතේ තවදුරටත් නිරවුල් කිරීම සඳහා ඉතිරිවී ඇති මුදලින් සියයට 57 කට ආසන්න වටිනාකමකින් යුතු බැරකමක් පැවතියදී අපේක්ෂා කල පරිදි වියදම් ඇති නොවීම ඉතිරිවීම් සඳහා හේතුවූ බව සඳහන් කිරීම විගණනයේදී පිළිගත හැකි කරුණක් නොවීය. | කළ යුතු වීම. | දන්වා සිටිමි. |
| (vi) වැය විෂයය අංක 1409 (සේවා - වෙනත්) වාර්ෂික ප්‍රතිපාදන වෙන් කිරිම රු.488,000,000 කි. එහි ප්‍රතිපාදන මුදලින් රු.400,000,000 ක් හෙවත් සියයට 82 ක් බහාලුම් ස්කෑන් කිරීම සහ සොයා බැලීමට අදාලව ගෙවීම් කිරීම වෙනුවෙන් වෙන් කර තිබුණි. එම වෙන් කල මුදලින් අවස්ථා 11 කදී රු.345,350,000 ක් මුදල් රෙගුලාසි 66/69 වීරමොං ක්‍රියාපරිපාටිය යටතේ වෙනත් වැය විෂයයන් 8 ක් වෙත මාරු කිරීම් සිදු කර තිබුණි. ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුව තවදුරටත් සියයට 26 ක ඉතිරිවීම් වාර්තා කර තිබුණි. ආනයන හා අපනයන බහාලුම් සියයට 100 ක් ස්කෑන් කිරීමේ ව්‍යාපෘතිය පසුගිය වර්ෂයේදී මෙන් සමාලෝචිත වර්ෂයේදීද ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමෙන් මේ අයුරින් ප්‍රතිපාදන මාරු කිරීමට මෙන්ම ප්‍රතිපාදන ඉතුරු වීම් සිදු වී ඇති බව නිරීක්ෂණය විය. මෙම ව්‍යාපෘතිය සඳහා ලංසු කැඳවීම 2015 නොවැම්බර් මස සිදු කර තිබුණු අතර 2019 ඔක්තෝබර් 21 දින මෙම වැඩසටහන ආරම්භ කිරීමේ උත්සවය ද පවත්වා තිබුණි. එසේ වුවත් මෙම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සක්‍රීය ක්‍රියාමාර්ග මේ වන විටත් ගෙන නොතිබුණි. | විචක්ෂණ ලෙස අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හා බහාලුම් ස්කෑන් කිරීමේ ව්‍යාපෘයේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වීම. | මෙම ව්‍යාපෘතිය දැනට පරීක්ෂණ ධාවන මට්ටමේ පවතින අතර මෙහි දිනකට මුදල් ගෙවිය යුතු බහාලුම් ප්‍රමාණය තවදුරටත් අඩු කර ගැනීමට Rapiscan Systems (Pvt.) Ltd, සමාගම, මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා රේගුව සමඟ සාකච්ඡා කරමින් සිටියි. [ප්‍රායෝගික ගැටලු කිහිපයක් නිසා බහාලුම් 1,100 ක් දිනකට පරිලෝකනය (scan) කිරීමට අපහසු හෙයින්] මෙම සාකච්ඡා අවසන් අදියරෙහි පවතී. දිනකට පරිලෝකනය සඳහා ගෙවිය යුතු අවම බහාලුම් ප්‍රමාණය අඩු කර සමාගමට ඉන් සිදුවන පඩුව වලක්වා ගැනීමට ගිවිසුම් කාලය දීර්ඝ කිරීමේ විසඳුමක් ලබා ගැනීමට සාකච්ඡා කරමින් පවතී. |

(ඇ) මූලධන වියදම්

---------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා මූලධන වියදම වෙනුවෙන් වෙන් කර තිබූ රු. 358,450,000 කින් සියයට 74.45 ක් වූ රු. 266,866,994 ක් වියදම් නොකර ඉතිරිව පැවතුණු අතර එය වැය විෂයයන් 09 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 10 සිට සියයට 100 | නිවැරදිව විචක්ෂණශීලීව ඇස්තමේන්තු සකස් කිරීම කළ යුතු වීම.. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. විගණනය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |

දක්වා වූ පරාසයක විය. එමෙන්ම මූලධන වැය විෂයය අංක 2104 (ගොඩනැගිලි හා ඉදිකිරීම්) හා 2401 (කාර්ය මණ්ඩල පුහුණු) යටතේ සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදිත මුදලින් පිළිවෙලින් 99.95 ක් හා සියයට 67.22 ක් ඉතිරිවීම් ලෙස වාර්තා කර තිබුණු අතර මෙම ඉතිරිවීම් සඳහා රේගු කළමනාකරණ හා වන්දි අරමුදලින් වියදම් දැරීම හේතුවූ බව සඳහන් කර තිබුණි. ඒ අනුව වෙනත් අරමුදල් මගින් ප්‍රතිපාදන සලසා ගැනීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කිරීමෙන් අනතුරුව වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී නිරීක්ෂණය විය.

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) බැරකම් නිවැරදිව අනාවරණය නොකිරීම | | |
| (i) වැය විෂයයන් 10 කට අදාල සමාලෝචිත වර්ෂය තුල එළැඹ තිබූ එකතුව රු.20,908,371 ක් වූ බැරකම් වටිනාකම භාණ්ඩාගාර මුද්‍රිතවල ඇතුළත් වී නොතිබුණි. | නිවැරදිව ගිණුම් වාර්තාකරණය සිදු කල යුතු වීම. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 269/2019 අනුව 2019 දෙසැම්බර් පරිපූරක ගිණුම් සාරාංශ 2020.01.21ට පෙර ඉදිරිපත් කළ යුතුව තිබූ අතර, එම දිනය වනවිට හඳුනාගත් බැරකම් විස්තර CIGAS පරිගණක වැඩ සටහන හරහා භාණ්ඩාගාරයට වාර්තා කරන ලදී. එම තොරතුරු SAG 2 ආකෘතියේ ඇතුළත් වන නමුත් මාසික ගිණුම් සාරාංශ භාණ්ඩාගාරය වෙත යැවීමෙන් පසුව හඳුනා ගන්නා ලද තොරතුරුද මූල්‍ය ප්‍රකාශනවල සටහන් iii හි ඇතුළත් කර ඇත. |
| (ii) වැය විෂයයන් 06 ට අදාලව බැරකම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ (සටහන් **III**) හා භාණ්ඩාගාර මුද්‍රිතයේ **(SA 92)** සඳහන්ව තිබුණි. එහෙත් එම වැය විෂයයන් 06 ක් අතරින් වැය විෂයයන් 02 ක බැරකම් වටිනාකම භාණ්ඩාගාර මුද්‍රිතයේ සඳහන් වටිනාකමට වඩා රු.9,807,794 ක් | නිවැරදිව ගිණුම් වාර්තාකරණය කළ යුතු වීම. | -එම- |

| | | |
|---|---|---|
| අඩුවෙන් ද වැය විෂයයන් 04 ක බැරකම් වටිනාකම භාණ්ඩාගාර මුද්‍රිතයේ සඳහන් වටිනාකමට වඩා රු.33,120,648 ක් වැඩියෙන්ද වාර්තා කර තිබූ බව නිරීක්ෂණය විය.<br>(iii) වැය විෂයයන් 02 කට අදාලව එකතුව රු.4,328,020 ක් වූ බැරකම් වටිනාකම භාණ්ඩාගාර මුද්‍රිතයේ (**SA 92**) සඳහන්ව් තිබුණද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ බැඳීම් හා බැරකම් ප්‍රකාශය (සටහන් **III**) තුල එම වටිනාකම් ඇතුලත් වී නොතිබුණි. | භාණ්ඩාගාර චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීම. | අතපසුවීමකින් මෙම වටිනාකම් සටහන් iii යටතේ ඇතුළත් කිරීමට නොහැකි විය. |

(ආ) ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹීම

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 94 (1) හා නිකුත් කර තිබුණු අනෙකුත් රාජ්‍ය ගිණුම් චක්‍රලේඛවල රෙගුලාසිවලට පටහැනිව 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් වැය විෂයයන් 02 කට අදාලව ප්‍රතිපාදන ඉක්මවා රු.6,544,528 ක් වූ බැරකම්වලට එළැඹ තිබුණි. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොඑළඹීම. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුලත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කල යුතු වුවත්, ශ්‍රී ලංකා රේගුව සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2020 ඔක්තෝබර් 08 වන දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.2 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ශ්‍රී ලංකා රේගු මූලස්ථාන ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කර ඇති Commins වර්ගයට අයත් විදුලි ජනන යන්ත්‍ර නඩත්තු කටයුතු සඳහා 2019 වර්ෂය තුළදී ලබාගත් සේවාවන් වෙනුවෙන් රු.3,512,574 ක් පෞද්ගලික සමාගමක් වෙත ගෙවීම් කර තිබුණි.<br>(අ) උක්ත සේවාවන් ලබාගත් ආයතනය Commins වර්ගය සඳහා ශ්‍රී ලංකාව තුළ සිටින එකම | චක්‍රලේඛ ප්‍රකාරව | Trade Promoters (PVT)Ltd ආයතනයට Cummins භාණ්ඩ සඳහා නියෝජිතයෙකු ලෙස |

| | | |
|---|---|---|
| නියෝජිතයා බැවින් එම ආයතනය තෝරාගත් බව සඳහන් කර තිබුණ ද, උක්ත සමාගමට Commins සඳහා වූ ශ්‍රී ලංකා නියෝජිතයා ලෙස කටයුතු කිරීමට ලබාදී තිබූ බලය 2018 ජනවාරි 16 දිනෙන් අවසන් වී තිබුණි. එහෙත් ඒ බව නොසලකා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට පටහැනිව මිල කැඳවීම් සිදු කර තරඟකාරී ආයතනවලට මේ සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ලබාදීම තුළින් වඩාත් සුදුසු ආයතනය තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම තුළින් වඩාත් වාසිදායක සැපයුම්කරුවන් තෝරා ගැනීමට වගබලා ගත යුතු වීම. | කටයුතු කිරීමට දී තිබූ බලය පැවරීම 2018.01.16 දිනෙන් අවසන් වී ඇත. Trade Promoters (Pvt) Ltd ආයතනයට Cummins භාණ්ඩ සඳහා නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව, බලය පැවරීම අවසන් වන දිනය හෝ කල් ඉකුත් වීමෙන් අනතුරුව වසරක් හෝ දක්වා යන දෙකෙන් මුලින් එළඹෙන දිනය තෙක් ඇති බවට අදාළ ආයතනය විසින් ලබාදී ඇති 2019.09.25 දිනැති ලිපියේ සඳහන්වේ. මෙම විදුලි ජනක යන්ත්‍රද සඳහා කටයුතු කිරීමේ දී තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව ඍජු කොන්ත්‍රාත් ක්‍රමය මගින් එම ආයතනය වෙතින් සේවා කිරීම් ඉටු කර ගන්නා ලදී. |
| (ආ) ශ්‍රී ලංකා රේගුවේ පරිශ්‍ර කළමනාකාරවරයා විසින් උක්ත සේවාව ලබා ගැනීම පිළිබඳව ලංකා විදුලි බල මණ්ඩලයෙන් විමසූ බවත් අදාල ජනන යන්ත්‍රය සඳහා අමතර කොටස් වෙළඳපලේ සුලබව පවතින බවත් විදුලි බල මණ්ඩලයේ කොලොන්නාව ජනන යන්ත්‍ර අංශය මගින් මෙම සේවාවන් වගකීමක් සහිතව අඩු මිලට කරගත හැකි බව විදුලි බල මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රේගුවේ සැපයුම් හා සේවා අධ්‍යක්ෂ වෙත දැනුම් දී ඇති බව වාර්තා වී තිබුණි. එහෙත් ශ්‍රී ලංකා රේගුවේ කළමනාකරණය මේ පිළිබඳව සැලකිලිමත් වී නොතිබුණ අතර මෙම ලිපිය අදාල ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | රජයේ අයිතිවාසිකම් ආරක්ෂාවන පරිදි කටයුතු කිරීම. | විදුලිජනක යන්ත්‍රයක් නැවත ස්ථාපිත කිරීමේදී තිබෙන ධාරිතාවෙන් යුතු විදුලිජනක යන්ත්‍රයක් පමණක් ස්ථාපිත කෙරේ. ඍජු මිලදී ගැනීම් යටතේ මෙම සේවාව ලබාගෙන ඇති බැවින් පිරිවිතර සමාලෝචනය කිරීමක් සිදුකර නොමැත. |
| (ඇ) සේවා සැපයුම් අධ්‍යක්ෂ විසින් විදුලි ජනන යන්ත්‍ර පරීක්ෂා කර බලා මිල ගණන් ඉදිරිපත් කරන ලෙස ලංකා විදුලි බල මණ්ඩලයට දැනුම් දුන් බවට ලිපියක් අදාල ගොනුවට ඇතුළත් කර තිබුණ ද එම ලිපිය තැපැලෙන්/ ලියාපදිංචි තැපැලෙන්/ ෆැක්ස් මගින්/ අතින් විදුලි බල මණ්ඩලය වෙත යැවූ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි. එබැවින් විදුලි බල මණ්ඩලයෙන් මේ පිළිබඳව කරුණු විමසූ බවට සාධාරණ තහවුරුවක් විගණනයට ලබා ගත නොහැකි වී තිබුණි. | රජයේ කටයුතු වඩාත් විනිවිදභාවයකින් හා තහවුරුවන ආකාරයට සිදු කිරීම. | විදුලි බල මණ්ඩලය වෙත කරනු දැනුම්දීම මත, එම ආයතනය විසින් රේගු ප්‍රධාන කාර්යාලය වෙත පැමිණ විදුලි ජනක යන්ත්‍ර නිරීක්ෂණය කරන ලද නමුත්, ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි. අවස්ථා කිහිපයකදීම විමසීම් කළත් මිල ගණන් ඉදිරිපත් නොකරන ලදී. |
| | රජයේ කටයුතු වඩාත් විනිවිදභාවයකින් හා තහවුරුවන ආකාරයට සිදු | විදුලි ජනක යන්ත්‍රයේ රේඩියේටරයේ එම ජල කාන්දුව නිරීක්ෂණය වීමට පෙර දෙවරක් අලුත්වැඩියා කර ඇත. යන්ත්‍රවල දෝෂ නිරීක්ෂණය වූ වහාම දෙපාර්තමේන්තුවේ කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යෑම |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවට අයත් නඩත්තු ඉංජිනේරුවරයා විසින් රේඩියේටරයෙහි ඇති වී තිබූ සුළු ජල කාන්දුවක් පිළිබඳව සැපයුම් සේවා අධ්‍යක්ෂවරයාට දැනුම් දී තිබූ අතර ඒ අනුව නව රේඩියේටරයක් මිලදී ගැනීමට Trade Promoters ආයතනයෙන් ලබා ගත් මිල ගණන් ද ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව,<br>• දෛනික පරීක්ෂාවේදී මෙම සුළු ජලකාන්දුව වලක්වා ගැනීමට පිළියම් නොයෙදීම<br>• අලුත්වැඩියාවක් කිරීමට ඇති හැකියාව සොයා නොබැලීම<br>• රේඩියේටරයේ සුළු ජලකාන්දුව දැනුම් දීමත් සමඟම නව රේඩියේටරයක් මිලදී ගැනීමට Trade Promoters ආයතනයේ මිල ගණන් ඉදිරිපත් කිරීම.<br>• Trade Promoters ආයතනයෙන් පැමිණි අංක 01 රේඩියේටරය පරීක්ෂා කළ බවට හෝ එම ආයතනයට මේ පිළිබඳව දැනුම් දුන් බවට හෝ මිල ගණන් විමසූ බවට කිසිදු සාක්ෂියක් ලිපිගොනුව තුළින් ඉදිරිපත් නොවීම.<br>• රු. 2,190,741 ක් ගෙවා උක්ත ආයතනය මගින් රේඩියේටරයක් නැවත සවි කිරීම සඳහා වූ ප්‍රසම්පාදනය සිදු කිරීමෙන් මාස 03 ට පසුව නැවත රු. 1,321,833 ක් ගෙවා උක්ත ආයතනය සමඟ සේවා ගිවිසුමකට යාමට යෝජනා කරමින් එම ආයතනයේම මිල ගණන් ඒ සමඟ ඉදිරිපත් කර තිබීම යනාදිය විගණනයේදී ප්‍රශ්නගත කරුණු විය. | කිරීම.<br><br>ටෙන්ඩර් ඇගැයීම් මණ්ඩලයේ වගකීම නිවැරදිව සිදු කිරීම. | අත්‍යාවශ්‍ය හෙයින්, අදාළ ආයතනය වෙත දුරකථන ඇමතුම් හරහා සම්බන්ධ වී එම ආයතනයේ නියෝජිතයෙක් හා සම්බන්ධවී අදාළ කටයුතු කරනු ලැබේ.ඉදිරියේ දී ඇතිවන ගැටලු අවම කර ගැනීම සඳහා සේවා ගිවිසුමක අවශ්‍යතාවය සලකා බලා ඒ සඳහා ප්‍රසම්පාදනය සිදු කරන ලදී.<br><br>විදුලි පද්ධතියේ හදිසි බිඳ වැටීමකදී විදුලිජනක යන්ත්‍රවලින් කරනු ලබන කාර්යභාරය සලකා වගකීමක් නොමැති ආයතන සමඟ කටයුතු කළ නොහැකි බැවින් එම නියෝජිත ආයතනයෙන්ම එම කාර්යය ඉටුකරගෙන ඇත. |
| (ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2:4:1 අනුව ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටු සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහාම වගකිව යුතු නමුත් මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී උක්ත කාර්යයේදී එසේ ක්‍රියාවලියට අනුගතව කටයුතු කර නොතිබුණි.<br><br>(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2:8:4 ප්‍රකාරව මේ සම්බන්ධයෙන් තාක්ෂණ ඇගැයීම් කමිටුවක් පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | තාක්ෂණික කමිටුව මගින් ඉටුවිය යුතු කාර්යභාරය ඉටු කිරීම. | ලංසු කැඳවීමකින් තොරව නියෝජිත ආයතනයක් වෙතින් මෙම සේවාව ලබා ගැනීමේදී ප්‍රසම්පාදන තීරණය සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු එකඟතාවය පමණක් ලබාගෙන ඇත. |

**3.3** **අවිධිමත් ගනුදෙනු**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව ත්‍යාග අරමුදලින්, ත්‍යාග වශයෙන් මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් රේගු ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා නිකුත් කර තිබූ 1988 ජනවාරි 28 දිනැති අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝග සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගත් බවට සාක්ෂි නොවීය. ඒ අනුව 1999 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ 21 ක් තුළ ත්‍යාග මුදල් ලෙස රු. 17,745,558,715 ක් ගෙවා තිබුණි. | අමාත්‍යවරයාගේ අනුමැතිය දැක්වෙන ක්‍රමවේදය විගණනය වෙත ඉදිරිපත් කිරීම. අනුමත ක්‍රියා පරිපාටියක් නොමැතිනම් එසේ සිදු කළ නිලධාරීන් සම්බන්ධව ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කිරීම. | 1956 දී ප්‍රකාශයට පත් කරන ලද රේගු ආඥා පනතේ 153 වන වගන්තිය මගින් ත්‍යාග ගෙවීමේ යාන්ත්‍රණය පිළිබඳ නිශ්චිතව දක්වා ඇත. රේගු ආඥා පනතෙහි පනවා ඇති විධිවිධානයන් යටතේ ලැබෙන ප්‍රතිලාභ ක්‍රමය රේගු ඉතිහාසයේ දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තු නියෝග (DOPL) 118 යනු වලංගු එමෙන්ම ක්‍රියාකාරී සහ බලාත්මක කළ හැකි ලේඛනයක් බවට අභියාචනාධිකරණය විසින් ගුණතිලක එදිරිව වීරසේන නඩුවෙහි තීන්දුව අනුව ප්‍රකාශ කර ඇත |
| (ආ) | ශ්‍රී ලංකා රේගුවට අනාවරණය නොකර ආනයනය කර තිබූ ව්‍යාජ වැසි අංකයක් සහිත Toyota Land Cruiser Prado (TRJ 150) රථයක් රේගු විමර්ශනයක් මගින් රාජසන්තක කර තිබුණු අතර පසුව 2009 අංක 08 දරන මෝටර් රථ වාහන ආඥා පනතෙහි 02 (උ) හා (ඌ) වගන්තිවලට පටහැනිව නව රේගු සටහන්කරයක් හා නව වැසි අංකයක් ලබා දී රු.13,500,000 ක තක්සේරු අගයකට ආර්ථික කටයුතු අමාත්‍යාංශයට ලබදී තිබුණි. | රේගු අධ්‍යක්ෂ ඇමතු මෝටර් රථ කොමසාරිස්ගේ **ACT/02/CC** හා 2006 නොවැම්බර් 07 දිනැති ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | එවැනි ලිඛිත නීතියක් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය කළෙමි. ඒ අනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවද නීතිමය ප්‍රතිපාදන නොමැතිව උක්ත වාහනය ලියාපදිංචි කර ඇති බව ඔබ විසින් නිරීක්ෂණය කර ඇත. එම වාහනය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතුය. ශ්‍රී ලංකා රේගුව විසින් රාජ සන්තක කල වාහන සඳහා නව වාහන අංකයක් හා වැසි අංකයක් ලබා දී නැවත මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කර තිබීමේ නීතිමය ප්‍රතිපාදන පිළිබඳව අපගේ දැනුවත් භාවයක් නොමැති අතර, අමාත්‍ය මණ්ඩල නිර්දේශය අනුව කටයුතු කර ඇත. |

## 3.4 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කටුනායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පැමිණීමේ පර්යන්තයෙහි පිහිටුවා ඇති රේගු කාර්යාලය තුල බාහිර පාර්ශවයකට පහසුවෙන් පැමිණිය නොහැකි හා දර්ශනය නොවන අයුරින් සකස් කල ස්ථානයක රේගු නිලධාරීන් විසින් භාවිතා කරනු ලබන වානේ අල්මාරියක් තුල රු.95,000 ක මුදලක් රඳවා තිබුණි. යථෝක්ත සඳහන් මුදල් රඳවා තිබුණේ කුමන අරමුණකින්ද යන්න පිළිබඳව එදින රාජකාරි කල නිලධාරීන් විගණයේදී අනාවරණය නොකල අතර උක්ත සේප්පුව තුළ වූ හිස් ලිපි කවර තුළ නිලධාරීන් නොවන පුද්ගලයින්ගේ නම් සඳහන් වී තිබුණු බැවින් එකී පුද්ගලයින් විසින් ලබාදුන් මුදල් අදාල ලිපි කවර තුළ පැවතුනේද යන්න විගණනයේදී ප්‍රශ්න ගත විය. | විගණන පරීක්ෂණය කරන අවස්ථාවේදී කරුණු අනාවරණය නොකර පසුව ඉදිරිපත් කළ කරුණු විගණනයට පිළිගැනීම අසීරු වේ. පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහයේ II කොටස ප්‍රකාරව කටයුතු කිරීම. | වානේ අල්මාරිය තුළ තිබූ මුදල් මෙම මස විශ්‍රාම යාමට නියමිත ජ්‍යොෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකුගේ සමුගැනීමේ සාදයකට හා කාලයක් රේගුවට සම්බන්ධව රැකියාව කර හදිසි හෘදයාබාදයකින් මිය ගිය අයෙකු වෙනුවෙන් පරිත්‍යාග කිරීම සඳහා රේගු නිලධාරීන් වෙතින් එකතු කළ මුදල් වේ. ඇමෙරිකානු ඩොලර් 01 ක මුදල බොහෝ කාලයක් එම කුඩා සේප්පුව තුළ තිබී ඇත. |
| (ආ) | කටුනායක බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයෙහි ශ්‍රී ලංකා රේගුවට අයත් සරප් අංශය සඳහා නිලධාරීන් දෙදෙනෙකු පැය 24 සේවා මුර ක්‍රමය (Roster) යටතේ තාවකාලික පදනමින් රාජකාරී කටයුතු කිරම සඳහා අනුයුක්ත කර තිබුණි. | | |
| | (i) පැය 24 සේවා මුරය තුළ දී එකතු කරන ලද සියළුම මුදල් හා චෙක්පත් සේවා මුරය අවසානයේදී බැංකු ගත කිරීම අදාල සේවා මුරය භාර ගත් නිලධාරීන්ගේ ප්‍රධාන රාජකාරිය විය. එහෙත් 2019 නොවැම්බර 25 දිනැති හා Q/24 787224 අංක දරන කුවිතාන්සිය මගින් දණ්ඩන වශයෙන් එකතු කර තිබූ රු.40,000 ක මුදල බැංකු ගත කිරීමට එදින සරප් රාජකාරියේ නිරත වූ නිලධාරීන් කටයුතු කර නොතිබුණි. එම මුදල් අනාරක්ෂිත අයුරින් කුවිතාන්සි පොත තුළ රඳවා තිබුණි. | ආදායම් ලැබීම්, බැංකු ගත කිරීම් හා වාර්තා කිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරීන්ගේ වගකීම පිළිබඳව අධීක්ෂණය විධිමත් කිරීම හා නීතිරීති චක්‍රලේඛවලට අනුකූල නොවීම සම්බන්ධ අවශ්‍ය පියවර ගැනීම. | විගණන නිරීක්ෂණ පිළිබඳව එකඟ වෙමි. |
| | (ii) 2019 නොවැම්බර් 26 දින පෙ.ව 11.17 ට සරප් අංශයේ සිදුකළ භෞතික මුදල් පරීක්ෂාවේදී බදු හා දණ්ඩන මුදල් ලෙස එකතු කර තිබූ රු.295,607 ක මුදලක් අදාල | ආදායම් ලැබීම්, බැංකු ගත කිරීම් හා වාර්තා කිරීම සම්බන්ධයෙන් | විගණන නිරීක්ෂණ පිළිබඳව එකඟ වෙමි. |

| | |
|---|---|
| නිලධාරීන් භාරයේ පැවතුණි. එම අවස්ථාව වන විට කුවිතාන්සි අංක N 878572 සිට N 878586 දක්වා කුවිතාන්සි 15 ක් නිකුත් කර තිබූ අතර එහි එකතු වටිනාකම රු.489,287 ක් විය. එම තොරතුරු දෛනික මුදල් පොතේ ද සටහන් කර තිබුණි. ඒ අනුව විගණන පරීක්ෂාව සිදු කරන අවස්ථාවේදී නිකුත් කර තිබූ කුවිතාන්සි අනුව තිබිය යුතු මුදලට වඩා රු.193,680 ක් අඩුවෙන් මුදල් භාරකරුවන් භාරයේ පැවතුණි. | අදාල නිලධාරීන්ගේ වගකීම පිළිබඳව අධීක්ෂණය විධිමත් කිරීම හා නීතිරීති චක්‍රලේඛවලට අනුකූල නොවීම සම්බන්ධ අවශ්‍ය පියවර ගැනීම. |

**3.5 පාඩු හා හානි**

--------------

මේ සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 වසරේ සිට 2018 දක්වා වූ කාලපරිච්ඡේදය තුල එකම වර්ගයේ මුද්‍රණ යන්ත්‍ර ආනයනය කල ආයතන දෙකක් විසින් එකිනෙකට වෙනස් රේගු සංකේත වර්ගීකරණ අංක (8443.32.40 හා 8443.32.90) යටතේ ඒවා නිශ්කාෂණය කර තිබුණි. එහිදී එක් ආයතනයක් නිවැරදි භාණ්ඩ වටිනාකම ප්‍රකාශ කර VAT, PAL, NBT යන බදු වර්ග ගෙවා තිබුණු අතර අනෙක් ආයතනය භාණ්ඩ වටිනාකම අඩුවෙන් සඳහන් කර තිබීම නිසා ගෙවීමට නියමිත බදු මුදලින් සියයට 50 කට වඩා අඩුවෙන් ගෙවීමට කටයුතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ) එක් ආයතනයක් මුද්‍රණ යන්ත්‍ර (Hitachi- Rx2– SD160W) 26 ක් ආනයනයේදී කිසිදු VAT මුදලක් ගෙවා නොතිබුණු අතර අනෙක් ආයතනය මුද්‍රණ යන්ත්‍ර 08 ක් ආනයනය කර VAT ගාස්තු ලෙස රු.721,896 ක් ගෙවා තිබුණි. | මුද්‍රණ යන්ත්‍ර නිශ්කාෂණය කිරීම නිවැරදි ලෙස සිදුවී ඇති බවට විමර්ශනයක් සිදු කිරීම. | මුද්‍රණ යන්ත්‍ර සඳහා **FAX, Scan** වැනි **(Multy Function)** පහසුකම් අඩංගු වේ නම් රේගු සංයෝජිත අංකය 8443.32.90 භාවිතා වේ. මුද්‍රණ කටයුතු පමණක් සිදු කරයි නම් 8443.32.40 භාවිතා කරයි. |
| (ආ) VAT නොගෙවන ලද ආයතනය මුද්‍රණ යන්ත්‍රයක් (Hitachi- Rx2– SD160W) රු.200,000 ක අගයක් ප්‍රකාශ කර තිබූ අතර අනෙක් ආයතනය රු.400,000 ක අගයක් ප්‍රකාශ කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) Accer මුද්‍රණ යන්ත්‍ර 83 ක් ආනයනය කර එයින් යන්ත්‍ර 14 ක් සඳහා රේගු සංයෝජිත වර්ගීකරණ අංකය (HS) 8443.32.90 යටතේ රු.88,812 ක VAT ගෙවා තිබුණ අතර ඉතිරි යන්ත්‍ර 69 සඳහා VAT නොගෙවා රේගු සංයෝජිත වර්ගීකරණ අංක 8443.32.40 යටතේ නිශ්කාෂනය කර ගෙන තිබුණි. | -එම- | -එම- |

**3.6** අනාර්ථික ගනුදෙනු

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල විවිධ හේතුමත ආනයනකරුවන් විසින් නියමිත බදු නොගෙවීම හේතුවෙන් බැංකු ඇපකර මත භාණ්ඩ නිදහස් කර තිබූ අවස්ථා 5502 න් සියයට 14 කට ආසන්න ප්‍රමාණයක් හෙවත් ඇපකර 752 නැවත නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි. | කල්පිරී ඇති බැංකු ඇපකර සම්බන්ධයෙන් ගත යුතු පියවර ගැනීමට කටයුතු කිරීම. | 2019.09.07 දිනට ඉතිරි බැංකු ඇපකර සංඛ්‍යාව 510 කි. මෙම බැංකු ඇපකර දීර්ඝ කාලයක් තිස්සේ රඳවා තබා ගැනීම රේගු නිලධාරීන්ගේ වදරකින් හෝ නොසලකා හැරීමකින් සිදුව නොමැති අතර එය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද තීන්දුවක් අනුව සිදුව ඇති බව නිරීක්ෂණය කෙරේ. |
| (ආ) | 2015 වර්ෂයේ සිට 2019 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා රේගුවේ අංශ 35 ක් විසින් ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම විමර්ශන ලියාපදිංචි පද්ධතිය (ECCR) යටතේ ලියාපදිංචි රේගු වැරදි සම්බන්ධයෙන් සිදුකර තිබූ විමර්ශන කටයුතු තුළින් රු. 33,845,962,239 ක් වූ ආදායමක් රැස්කර තිබුණි. ඉන් සියයට 69 ක් රැස්කර තිබුනේ දණ්ඩන ආදායම් ලෙස හා විකුණුම් ආදායම් ලෙසයි. දණ්ඩන ආදායමෙන් හා විකුණුම් ආදායමෙන් සියයට 70 ක් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට හා කළමනාකරණ වන්දි අරමුදලට බැරවන බැවින් සියයට 30 ක් පමණක් ඒකාබද්ධ අරමුදලට බැර වේ. ඒ අනුව විමර්ශන කටයුතු මගින් ලබාගෙන තිබූ රු.33,845,962,239 ක් වූ සමස්ථ ආදායමෙන් රු.16,341,023,479 ක්ම ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් හා ඔත්තුකාරයන් වෙනුවෙන් බෙදී ගොස් තිබුණි. රේගු නිලධාරීන්ට ත්‍යාග බෙදාහැරීම සඳහා සහ නිලධාරීන්ගේ සුභසාධන අරමුදල්වලට මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් අතීතයේදී පනවා ඇති නීතින් කාලීනව සංශෝධනයට ලක්වීම සිදුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය. නිලධාරීන් විසින් ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරී ස්වරූපයෙන් සිදු කරන ඇතැම් කාර්යයන් සඳහා ද දැනට ක්‍රියාත්මක වන ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ විශාල වශයෙන් ත්‍යාග මුදල් ගෙවීමට සිදුවී තිබීම නිසා භාණ්ඩාගාරයට හිමි විය යුතු විශාල මුදලක් රජයේ | රජයේ ආදායම සුරක්ෂිතභාවය සුරකෙන පරිදි කටයුතු කිරීම හා දැනට පවතින ක්‍රමවේදය නැවත සමාලෝචනය කිරීම. | පිළිතුරු ලබා දී නොමැත. |

නිලධාරීන් සීමිත පිරිසක් අතර බෙදී යාමේ ප්‍රවණතාවයක් දිගින් දිගටම පවතින බව නිරීක්ෂණය විය.

## 3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විදේශීය රටවල සේවයේ නියුතු ශ්‍රී ලංකිකයන් හට තම පෞද්ගලික පරිහරණය සඳහා අවශ්‍ය භාණ්ඩ රැගෙන ඒම පිණිස රජය විසින් හඳුන්වාදී ඇති කැටුව නොගෙනෙන ගමන් බඩු (UPB) හා ත්‍යාග (GIFT) යන යෝජනා ක්‍රමයන් උපයෝගී කරගෙන සිදු කරනු ලබන භාණ්ඩ ප්‍රවාහනය සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආයතන 11 ක් ස්ථාපිත කර තිබුණි.<br>එහෙත් ත්‍යාග (GIFT) ක්‍රමයට මෙරටට එවනු ලබන භාණ්ඩවල වර්ගීකරණය, බර, ප්‍රමාණය හා වටිනාකම පිළිබඳ තොරතුරුවල නිවැරදිතාවය පසු අවස්ථාවකදී පරීක්ෂා කිරීම සඳහා කිසිදු ක්‍රමවේදයක් ශ්‍රී ලංකා රේගුව සතු නොවීය. ඒ හේතුවෙන් එම භාණ්ඩ රැගෙන එන මගීන් හා රේගු නිලධාරීන් අතර දූස්සන්ධානයක් ගොඩනැගිය හැකි වීමත් ඒ තුලින් නිවැරදි තොරතුරු ප්‍රකාශ නොකළ හැකි වීමත් හා ඒ මත රජයේ බදු ආදායම සුරක්ෂිත විය නොහැකි වීමත් යනාදි අවධානම් රැසක් දීර්ඝ කාලයක සිට පැවති බව නිරීක්ෂණය විය. එමෙන්ම නීතිවිරෝධී ආනයනයන් හා රජය විසින් සීමා කර ඇති භාණ්ඩ රට තුලට පැමිණීමේ අවධානමක් පවතින බවත් සුරක්ෂිතාගාරයන්හි පවතින භෑණ්ඩ ආරක්ෂාකාරීබව, නිසි ලේඛන නඩත්තුව, ගබඩා පිළිවෙත් අනුගමනය නොකරන බවත් තහවුරු විය. | UPB/ GIFT ක්‍රමයන්හි කාර්යපරිපාටිය සමාලෝචනය කර රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම. | UPB හෝ පාර්සල් නිශ්කාශනය සඳහා වන රේගු ක්‍රියා පරිපාටියට අනුව ඒවා පරීක්ෂා කර නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයෙකු, රේගු අධිකාරීවරුන්, සහකාර ශාස්තු නිලධාරීන් හා රේගු පරීක්ෂකවරුන්ගේ මැදිහත්වීමෙන් එය සිදු කරනු ලබන අතර එහිදී යම්කිසි දුෂ්කරතාවයක් ඇති වීමට අවස්ථාවක් ඇති නොවන බව නිරීක්ෂණය කරමි.<br>සුරක්ෂිතාගාරය තුළ ඇති භාණ්ඩවල ආරක්ෂාව වෙනුවෙන් මීයන් හා කෘමි සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට අදාළ ක්‍රියා මාර්ග අනුගමනය කර ඇත. කෙසේවෙතත් පාලනය කළ නොහැකි හේතු සහ ඇතැම් භාණ්ඩවල ස්වභාවය නිසාම භාණ්ඩ නරක්වීම සිදුවිය හැකිය. සුරක්ෂිතාගාරය තුළ පවතින භාණ්ඩ හඳුනාගැනීම සඳහා ලේඛන සකස් කර, අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | ශ්‍රී ලංකාව වෙත ආනයනය කරනු ලබන භාණ්ඩ ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කිරීමේදී විවිධ හේතුන් මත සාමාන්‍ය බදු ගෙවීමේ ක්‍රමවේදයෙන් බැහැරව සිදු කරනු ලබන අවස්ථාවලදී ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම ශ්‍රී ලංකා රේගුවේ "D" | අදාල පාර්ශවයන් සඳහා කාර්ය පැවරුම් විධිමත් පරිදි පැවරීම. | "ඩී" අංශයේ රාජකාරී සහ ව්‍යුහය වෙනස් කොට රේගු අධ්‍යක්ෂගේ සහ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරුන්ගේ අනුමැතියෙන් නව රාජකාරී |

| | | | |
|---|---|---|---|
| | අංශය මගින් සිදු කරනු ලබයි. 2019 වර්ෂය සඳහා "D" අංශය සඳහා රේගු අධ්‍යක්ෂ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර දක්වා වූ තනතුරු 06 කට අයත් නිලධාරීන් 15 දෙනෙකු අනුයුක්ත කර තිබූ අතර මෙම එක් එක් නිලධාරීන්ගේ තනතුරුවලට අදාලව ලිඛිත කාර්යභාරයන් පැවරීමක් සිදු කර නොතිබුණි. | | පැවරුම් ලේඛන සකස් කරමින් පවතී. |
| (ඇ) | ලක්සිරි හා ට්‍රයිකෝ සේවා මධ්‍යස්ථාන විසින් පවත්වාගෙන යන බන්ධිත ගුදම් පරිශ්‍රවල ඇතැම් ස්ථානවල ආරක්ෂිත කැමරා සවිකර තිබුණ ද අත්‍යාවශ්‍යම ස්ථානය වන භාණ්ඩ හා ගමන් මළු ශ්‍රී ලංකා රේගු නිලධාරීන් විසින් පරීක්ෂා කරන ස්ථානය අදාල ආරක්ෂිත කැමරා මගින් ආවරණය වී නොතිබුණි. | ආරක්ෂිත කැමරා අධීක්ෂණය අඛණ්ඩව සිදු කිරීම හා අත්‍යාවශ්‍ය ස්ථාන ආවරණය වන ලෙස කැමරා පද්ධති වැඩි දියුණු කිරීම. | එම ආයතන පරිශ්‍රය තුළ අවශ්‍ය ස්ථානවල කැමරා සවිකර ඇති අතර භාණ්ඩ පරීක්ෂා කරන ස්ථානයේ කැමරා සවිකිරීමට අවශ්‍යතාවයක් නොමැති බව නිරීක්ෂණය කරන අතර, අදාළ භාණ්ඩ පරීක්ෂා කිරීමේ කටයුතු අධීක්ෂණය නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයෙකුගේ හා රේගු අධිකාරිවරුන්ගේ අධීක්ෂණය යටතේ සිදු කෙරෙයි. තවද එම භාණ්ඩ පරීක්ෂා කිරීම අදාළ මඟීන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා වන පරිදි සිදු කළ යුතු බව නිරීක්ෂණය කරමි. |
| (ඈ) | ආනයනකරුවන් විසින් වරාය පරිශ්‍රයෙන් ඉවත් කර නොගන්නා ආනයනික භාණ්ඩ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ටෙන්ඩර් මගින් විකිණීමට කටයුතු කිරීමේදී ශ්‍රී ලංකා රේගුව විසින් එම භාණ්ඩවල වටිනාකම තීරණය කරන ලබයි. එසේ තීරණය කරන වටිනාකම් හා භාණ්ඩ අලෙවි වන හෝ ඉදිරිපත් වන ලංසුවල වටිනාකම් අතර ඉහළ විචලතාවයක් පැවතුණි. භාණ්ඩවල වටිනාකම අඩුවෙන් තක්සේරු කිරීම නිසා රජයට අයවිය යුතු බදු ආදායම අහිමි වීම මෙන්ම භාණ්ඩ අධි තක්සේරු කිරීම හේතුවෙන් ඒවා අලෙවි නොවී පැවතීම නිසා වෙළඳපල අගය අඩු වීම, භාණ්ඩ විනාශ වීම, නැවත නැවත ටෙන්ඩර් සඳහා ඉදිරිපත් කිරීමට අමතර පිරිවැයක් හා පරිශ්‍රමයක් දැරීමට සිදුවීම වැනි අඩුපාඩු පැවති බව නිරීක්ෂණය විය. එමෙන්ම ටෙන්ඩර් මගින් අලෙවි කරන භාණ්ඩ වල වටිනාකම තීරණය කළ ආකාරය පිළිබඳ තොරතුරු හා යොදාගත් රේගු සංයෝජිත වර්ගීකරණ අංක (HS CODE) මොනවාද යන්න පිළිබඳ තොරතුරු ගොනු තුළ ඇතුලත් නොකර තිබුණි. එම නිසා තීරණය කළ වටිනාකම හා අයකළ බදු වටිනාකමෙහි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි වීම හා එක් ටෙන්ඩරයකදී අලෙවි නොවූ භාණ්ඩ ඊළඟ ටෙන්ඩරය සඳහා ඉදිරිපත් වන්නේද, එසේ | වරායේ අත්හල භාණ්ඩ විකිණීමේ ක්‍රියාවලිය සමාලෝචනය අඛණ්ඩව හා කාර්යක්ෂමව සිදු කිරීම. | අත්හල භාණ්ඩවල ටෙන්ඩර් මිල තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් විවිධ නිර්ණායකයන් භාවිතා කරනු ලැබේ. භාණ්ඩයේ වෙළඳපොල වටිනාකම, භාණ්ඩය ශ්‍රී ලංකාවට ගොඩබාන විට එහි **CIF** වටිනාකම, භාණ්ඩ සඳහා අදාල වන තීරු බදු අගය, භාණ්ඩ නිපදවා ඇති රට, භාණ්ඩවල තත්ත්වය, භාණ්ඩ නිපදවා ඇති කාලය, ඉන් ප්‍රධාන කාරණා වන අතර මේ සියල්ලක්ම සැලකිල්ලට ගනිමින් අදාල භාණ්ඩ ටෙන්ඩරයේදී විකිණිය යුතු වටිනාකම තීරණය කරනු ලබයි. |

| | | | |
|---|---|---|---|
| | නොවන්නේ නම් ඊට හේතු මොනවාද යන්න පිළිබඳව ශ්‍රී ලංකා රේගුව විසින් අනුක්‍රමික පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | | |
| (ඉ) | ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශය (CDU) විසින් වෙන්දේසියේ විකුණනු ලබන භාණ්ඩ සඳහා නිවැරදි තක්සේරු වටිනාකමක් ලබා නොදීම නිසා රජයට විශාල වශයෙන් බදු මුදල් අහිමි වීමක් සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව ආනයනකරුවන් විසින් වරාය පරිශ්‍රයන් තුළින් ඉවත් කර නොගැනීම නිසා ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශය (CDU) මගින් 2019 වර්ෂය තුළදී ටෙන්ඩර් කැඳවා විකුණා තිබූ වාහන පිළිබඳව සිදු කළ නියැදි පරීක්ෂාවට අනුව ටෙන්ඩර් 03 ක් මගින් විකුණා තිබූ වාහන 07 ක් සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ලබාදී තිබූ තක්සේරු වටිනාකම රු. 19,427,888 ක් වුවද වෙන්දේසි විකුණුම් වටිනාකම රු. 32,172,000 ක් වී තිබුණි. ඒ අනුව තක්සේරු වටිනාකම මත පමණක් බදු අයකිරීමට කටයුතු කිරීම නිසා එහිදී රජයට ලැබී තිබූ බදු ආදායම රු. 3,174,824 ක් වුවද විකුණුම් වටිනාකම මත අයවිය යුතු බදු මුදල රු.5,345,789 ක් වූයෙන් විචලතාවය මත අහිමි වී තිබූ බදු ආදායම රු.2,170,965 ක් විය. | මධ්‍යම අපහරණ අංශය (CDU) විසින් සිදු කරන වෙන්දේසියේ භාණ්ඩ විකිණීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම. | ශ්‍රී ලංකා රේගුවේ තක්සේරු මිලත්, භාණ්ඩ අලෙවිවන මිලත් අතර විශාල විචල්‍යතාවයක් පවතින්නේ ශ්‍රී ලංකා රේගුවේ භාණ්ඩවල මිල තක්සේරු කිරීමේ ක්‍රමවේදයෙහි දුර්වලතාවයක් නිසා නොව හුදෙක්ම ලංසුකරුවන්ගේ පෞද්ගලික තීරණ නිසා වන බව පෙනී යයි. |
| (ඊ) | ඇපකර පරීක්ෂාව<br>-------------------- | | |
| | (i) බහාලුම් පරීක්ෂණ අංශය විසින් 2019 ජූලි 10 දින වනවිට රු. 112,841,773 ක් වටිනා බැංකු ඇපකර 60 ක් ලබාගෙන තිබූ අතර ඉන් ඇපකර 31 ක්ම දින 156 සිට දින 823 දක්වා කාලයක් ආනයනකරුවන් විසින් නිදහස් කර නොගත් රු.78,003,551 ක් වටිනා ඇපකර විය. උක්ත අවස්ථා 31 න් අවස්ථා 2 ක් හැර අනෙකුත් සියළු අවස්ථාවලදී භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ ගැටළු හේතුවෙන් මෙසේ බැංකු ඇපකර මත භාණ්ඩ නිදහස් කර තිබුණි. භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ ගැටළුවලට අදාල තීරණ ලබාදීම සඳහා NC (Nomenclature Classification) කමිටුව හා භාණ්ඩ වර්ගීකරණ අංශය (Clarification Unit) කඩිනමින් කටයුතු නොකිරීම හේතුවෙන් බැංකු ඇපකර දිගු කාලයක් රඳවා ගැනීමට සිදු වීමත් රජයට අයවිය යුතු බදු අයකර ගැනීම ප්‍රමාද වීමත් නිසා මුදලේ කාලීන වටිනාකම අවප්‍රමාණයට සාපේක්ෂව | ඇපකර මත නිදහස් කර ඇති භාණ්ඩ සඳහා ඊට හේතු වූ කරුණු සම්බන්ධව සමාලෝචනයක් කිරීම හා රේගුවේ භාණ්ඩ වර්ගීකරණ ඒකකය **(CCU)** හා **NC** කමිටු තීරණ ලබාදීමේ ප්‍රමාදයන් ඇතිවීම වැළැක්වීමට පියවර ගැනීම. | NC කමිටුව හා වර්ගීකරණ අංශය විසින් භාණ්ඩ වර්ගීකරණ ගැටළු සම්බන්ධව අවසන් තීරණය නිකුත් කරන තෙක් බැංකු ඇපකරවල කාලය දීර්ඝ කිරීමට සිදුවේ. නඩත්තු කරනු ලබන ලේඛන සහ බැංකු ඇපකර කළමනාකරණ පද්ධතිය සැසඳීමේදී පහත කරුණු සනාථ විය.<br>i. 2020.01.06 දින වන විට ලේඛන අනුව නිරවුල් නොවූ බැංකු ඇපකර සංඛ්‍යාව 40 ක් වූ අතර එහි වටිනාකම රු.125,098,810.60 කි.<br>ii. නිරවුල් වූ බැංකු ඇපකර 28 ක් බැංකු ඇපකර කළමනාකරණ පද්ධතියෙහි |

රජයට විශාල අලාභයක් සිදුවන බව නිරීක්ෂණය වී තිබුණි.

බහාලුම් පරීක්ෂණ අංශය විසින් සමාගම් ඇපකර හා පෞද්ගලික ඇපකර සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන ලේඛන නිසි පරිදි යාවත්කාලීන කර නඩත්තු කර නොතිබුණු අතර දීර්ඝ කාලයක් තිස්සේ නිරවුල් නොකළ ඇපකර පැවතීමත් ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවේ ප්‍රමාණවත් අධීක්ෂණයක් ද සිදු වී නොතිබුණි.

බහාලුම් පරීක්ෂණ අංශයට අදාල බැංකු ඇපකර සම්බන්ධයෙන් ආසිකුඩා පරිගණක පද්ධතියෙහි (Asycuda World Bank Guarantee Management System) ඇතුළත් තොරතුරු හා බැංකු ඇපකර සම්බන්ධව එම අංශය නඩත්තු කරනු ලබන ලේඛනවල ඇතුළත් ඇපකර වටිනාකම්, ඇපකර ප්‍රමාණය, යොමු අංක යනාදියෙහි වෙනස්කම් පැවති බවද නිරීක්ෂණය විය. කල්පිරෙන ඇපකර සම්බන්ධ තොරතුරු ස්වයංක්‍රීයව දැනුවත් කෙරෙන ක්‍රමවේදයක් සකසා නොතිබීම හේතුවෙන් නිරන්තර අධීක්ෂණයට ලක් කළ යුතුව තිබුණිද එසේ සිදු වී නොතිබුණි.

(ii) ප්‍රධාන කාර්යාලයේ "රැන්ක් බහාළුම් අංශය" (RCT) නඩත්තු කරන ලේඛන අනුව රු.112,841,773 ක් වටිනා බැංකු ඇපකර 60 ක් නිරවුල් නොවී තිබුණ ද බැංකු ඇපකර කළමනාකරණ පද්ධතිය අනුව රු.201,693,693 ක් වූ බැංකු ඇපකර 93 ක් නිරවුල් නොවී පවතින බව දක්වා ඇත.

(iii) බැංකු ඇපකර ලේඛන අනුව රු.3,289,872 ක් වූ වටිනාකම බැංකු ඇපකර පද්ධතියෙහි රු.14,566,898 ක් ලෙස සඳහන් කර තිබුණි.

වෙනස්කම් සඳහා හේතු පරීක්ෂාවන් සිදුකර නිවැරදි වටිනාකම් තහවුරු කිරීම.

-එම-

නිදහස් කොට යාවත්කාලීන වී නොමැති අතර එහි වටිනාකම රු.90,923,707/- කි. එම බැංකු ඇපකර කළමනාකරණ පද්ධතියෙන් නිදහස් කිරීම සඳහා පියවර ගෙන ඇත.

- ඇපකර ලිපිගොනු අංක RCT/BG/56/2018 අදාළ වූ බැංකු ඇපකරයේ වටිනාකම රු.3,000,000/- ක් වේ. අදාළ ලේඛනවල එය නිවැරදිව සටහන් වී ඇත. බැංකු ඇපකර පද්ධතියේ එය වැරදීමකින් ඇතුළත් කර ඇත්තේ රු. 13,247,629 ක් ලෙසය. එම අගය අංක I 164268 දරන රේගු සටහන්කරයේ වටිනාකම (statistical value) (cage No. 46) වේ. එය අදාළ ඇපකර තොරතුරු පද්ධතියේ නිවැරදි කිරීම සඳහා පියවර ගන්නා ලදී.
- ඇපකර ලිපිගොනු අංක RCT/BG/62/2018 ට අදාළ වූ බැංකු ඇපකරයේ වටිනාකම රු.289,872/- කි. අදාළ ලේඛනවල එය නිවැරදිව සටහන් වී ඇත. බැංකු ඇපකර පද්ධතියේ එය වැරදීමකින් ඇතුළත් කර ඇත්තේ රු.1,319,241 ක් ලෙසය. එම අගය අංක I 189489 දරන රේගු සටහන්කරයේ වටිනාකම (statistical value) (cage No. 46) වේ. කෙසේවෙතත්, එම බැංකු ඇපකරය 2019.09.18 දින නිදහස් කර ඇත.

-එම -

(උ) රේගු විමර්ශන සම්බන්ධ කාර්යසාධනය

-------------------------------------------

| | | | |
|---|---|---|---|
| (i) | 2015 වර්ෂයේ සිට 2019 ජුනි 30 දක්වා කාලපරිච්ඡේදය තුළ රේගු විමර්ශන 32572 ක් ලියාපදිංචි වී තිබුණු අතර ඉන් 15531 ක් එනම් සියයට 48 ක්ම විගණිත දිනය වන තෙක්ම විමර්ශන කටයුතු ආරම්භ කර නොතිබුණි. සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් එනම් විමර්ශන 7241 ක්ම 2015 වර්ෂයේ ආරම්භ කළ විමර්ශන විය. | රේගු විමර්ශන ආරම්භ කිරීමට ප්‍රමාදයන් සමාලෝචනය කිරීම හා විමර්ශන කටයුතු අවසන් කර රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම. | මේ පිළිබඳව අදාළ අංශ දැනුවත් කර භෞතික ලේඛනවල ඇති තොරතුරු හා රේගු විමර්ශන ලියාපදිංචි පද්ධතියේ තොරතුරුවල පරස්පරතාව අඩු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | උක්ත කාලපරිච්ඡේදය තුළ, රේගු විමර්ශනය ආරම්භ කිරීමට අදාල රේගු වරද කුමක්ද යන්න සඳහන් කිරීමේදී වැඩිම වාර ගණනක් එනම් අවස්ථා 8047 ක් "NULL" ලෙස සඳහන් කර තිබුණි. එනම් රේගු වරද කුමක්ද යන්න නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව රේගු විමර්ශන ආරම්භ කර තිබුණි. | රේගු විමර්ශන ආරම්භ කිරීමට ප්‍රමාදයන් සමාලෝචනය කිරීම හා විමර්ශන කටයුතු අවසන් කර රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම. | විමර්ශන ගොනුවක් ආරම්භ කර අවසන් කිරීමට ගත වූ කාලය eCCR දත්ත අනුව මැනීම අපහසුය. රේගු දෙපාර්තමේන්තුවේ අංශවලට ලබා දී ඇති eCCR ගිණුමේ ප්‍රවේශ සීමාව තුළ eCCR හි ලියාපදිංචි කර ඇති සියළුම ගොනු පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමේ දී ලියාපදිංචි කිරීමට අදාළ රේගු වරද (Offence Category) එම වාර්තාවට ඇතුළත් නොවේ. |
| (iii) | එකම ආයතනයන් විසින් නැවත නැවත රේගු වැරදි සම්බන්ධයෙන් වරදකරු වී තිබුණු අතර උක්ත කාලපරිච්ඡේදය තුළ අවස්ථා 50 කටත් වැඩි වාර ගණනක් එසේ වැරදිකරුවන් වූ ආයතන 18 ක් පැවතුණි. අඛණ්ඩව රේගු වැරදි සිදුකරන ආයතන/ පුද්ගලයින් හඳුනා ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ශ්‍රී ලංකා රේගුව විසින් ගොඩනගා නොතිබුණි. | රේගු වැරදි සිදු කිරීම අධෛර්යට පත් කරන ක්‍රමවේදයකට එළඹීම. | එකම ආයතනයක් විසින් භාණ්ඩ ආනයනය කිරීමේදී අවස්ථා 50 ට වැඩි වාර ගණනක් රේගු වැරදි සම්බන්ධව වැරදිකරු වී තිබූ ආයතන 18ක් නිරීක්ෂණය වූ අතර සිදුකර ඇති රේගු වැරදි සංඛ්‍යාවේ එකතුව 3483 ක් වේ. රේගු වැරදි සම්බන්ධව විමර්ශන ආරම්භ කර තිබූ අංශ අතරින් ආදායම් අධීක්ෂණ අංශය යටතේ 2212 ක් විමර්ශන සිදු කර තිබූ බව නිරීක්ෂණය කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | Carnet යෝජනා ක්‍රමය මගින් නියමිත බදු අයකිරීමකින් තොරව ප්‍රති අපනයනය හෝ ප්‍රති ආනයනය කිරීමේ තාවකාලික පදනම මත භාණ්ඩ ආනයනය හා අපනයනයට පහසුකම් සලසා දී තිබුණ ද මේ සම්බන්ධව පහත දක්වා ඇති පරිදි අඩුපාඩු ගණනාවක් පවතින බව විගණනය විසින් පෙන්වා දී තිබුණ ද ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.<br>(i) ආනයන හා අපනයන අංශවල වෙන වෙනම තබන සටහන් හා ලේඛනගත කිරීම් නැවත සැසඳීමක් සිදු නොකිරීම<br>(ii) පසු විපරම් සිදුකර නියමිත කාලවකවානු තුළ ප්‍රතිඅපනයන හෝ ප්‍රති ආනයනය සිදු වී තිබුණ බව තහවුරු කර ගැනීමට කටයුතු නොකිරීම.<br>(iii) නියමිත කාලවකවානු තුළ ප්‍රතිඅපනයන හා ප්‍රතිආනයනය සිදුකර නොතිබූ ආයතන/පුද්ගලයින් පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකිරීම.<br>(iv) Carnet ක්‍රමය යටතේ ආනයනය කර මෙරටදී අපහරණය සිදුකර ඇති භාණ්ඩ හෝ මෙරට භාවිතය සඳහා යොදාගෙන ඇති භාණ්ඩ සම්බන්ධයෙන නියමිත බදු අය කර ගැනීමට කටයුතු නොකිරීම. | විධිමත් පසුවිපරම් ක්‍රමවේදයක් සැකසීම. | මේ සම්බන්ධයෙන් පසුවිපරමක් සිදු කිරීම ගුවන් බඩු අංශයෙන් පමණක් සිදු කළ නොහැක. ගුවන් බඩු අංශයට වඩා පුළුල් පරාසයකට මෙය අදාළ වන බැවින් මේ පිළිබඳ ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා අවධානය යොමු කර ඇති බව කාරුණිකව දන්වමි. |
| (එ) | ලක්සිරි සේවා මධ්‍යස්ථානයට (UPB Warehouse) අනුයුක්ත කර තිබූ ස්ථිර 16 ක් හා කෘත්‍යගත 06 ක් ලෙස 22 ක් වූ කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ පැමිණීම පිටවීමෙහි ඇති අභ්‍යන්තර පාලනයෙහි දුර්වලතා ගණනාවක් පැවතුණි. | අභ්‍යන්තර පාලනයන් විධිමත් කිරීම. ශ්‍රී ලංකා රේගුවේ සියලුම අංශවල මෙම අඩුපාඩු පවතින බැවින් ඒවා විධිමත් කිරීම සඳහා පොදු ක්‍රියාමාර්ගයක් ගැනීම. | පැමිණීමේ හා පිටවීමේ ලේඛණවල විගණනය විසින් පෙන්වා දී ඇති අඩුපාඩු නිරීක්ෂණය කර ඒවා නිවැරදි කිරීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. මේ වන විට විගණනයේ පෙන්වා දී තිබෙන ආකාරයට නිවැරදිව පවත්වාගෙන යනු ලබයි. |
| (ඒ) | කටුනායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයෙහි සේවයේ නියුතු රේගු කාර්යමණ්ඩලය සඳහා පැමිණීම පිටවීම සම්බන්ධයෙන් පැවති අභ්‍යන්තර පාලන දුර්වලතා නිවැරදි කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | අභ්‍යන්තර පාලනයන් විධිමත් කිරීම. ශ්‍රී ලංකා රේගුවේ සියලුම අංශවල මෙම අඩුපාඩු පවතින බැවින් | මගී සේවා (කටුනායක) අංශයේ පවත්වාගෙන යනු ලබන පැමිණීම හා පිටවීම සටහන් කරනු ලබන ලේඛනය විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇති අතර එය |

| | | |
|---|---|---|
| | ඒවා විධිමත් කිරීම සඳහා පොදු ක්‍රියාමාර්ගයක් ගැනීම. | රේගු අධ්‍යක්ෂ (මගී සේවා) හා නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ විසින් අධීක්ෂණය කරනු ලබයි. විධිමත්ව පැමිණීම හා පිටවීම යෙදීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඔ) කටුනායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ පැමිණීමේ පර්යන්තයට අනුයුක්තව සිටි ස්ථිර රේගු කාර්යමණ්ඩලවල රේගු නිලධාරීන් සඳහා<br>(i) නිවාඩු ලේඛනයක් හෝ කෙටි නිවාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.<br>(ii) බැහැර යාමේ ලේඛනය හා අතිකාල ලේඛනය අඩුපාඩු සහිතව පවත්වාගෙන ගොස් තිබුණි. | අභ්‍යන්තර පාලනයන් විධිමත් කිරීම. ශ්‍රී ලංකා රේගුවේ සියලුම අංශවල මෙම අඩුපාඩු පවතින බැවින් ඒවා විධිමත් කිරීම සඳහා පොදු ක්‍රියාමාර්ගයක් ගැනීම. | සියලු කෙටි නිවාඩු ලේඛන සැකසීමට අවශ්‍ය කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඕ) කටුනායක අන්තර්ජාතික ගුවන්තොටුපලේ පැමිණීමේ පර්යන්තය භාවිතා කර සංවිධානාත්මක අයුරින් වාණිජ ස්වරූපයේ භාණ්ඩ නිරන්තරයෙන් රැගෙන ඒම දීර්ඝ කාලයක් තිස්සේ සිදු වන අතර 2019 ජනවාරි 01 සිට 2019 නොවැම්බර් 30 දින දක්වා කාලපරිච්ඡේදය තුල එසේ ගෙන විත් තිබූ වාණිජ ස්වරූපයේ භාණ්ඩවල රේගු තක්සේරු වටිනාකම රු.605,796,308 ක් විය. උක්ත භාණ්ඩ පරීක්ෂා කිරීම, බදු අය කිරීම සම්බන්ධයෙන් විගණනය විසින් පෙන්වා දී ඇති පහත සඳහන් අභ්‍යන්තර පාලන පිළිවෙත් අනුගමනය කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. | | |
| (i) අභ්‍යන්තර චක්‍රලේඛවල (DOPL) සඳහන් නෛතික විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම | දෙපාර්තමේන්තු නියෝග පිළිපැදීම හා අභ්‍යන්තර පාලන ක්‍රමවේද යාවත්කාලීනව ක්‍රියාත්මක කිරීම. | මෙම විධිවිධාන අනුව කටයුතු කිරීමට යළිත් අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) කාලීන අවශ්‍යතාවයන්ට අනුකූලව අභ්‍යන්තර චක්‍රලේඛ යාවත්කාලීන කිරීම හා සරප් අංශයේ කටයුතු විධිමත් කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම. | -එම- | -එම- |

| | | |
|---|---|---|
| (iii) ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කැමරා (CCTV) සවි කිරීම හා එම කැමරා දර්ශන අඛණ්ඩව අධීක්ෂණය කිරීම. | -එම- | මේ සඳහා නිලධාරීන්ට යලිත් අවශ්‍ය උපදෙස් ලබා දුන් බව කරුණිකව දන්වා සිටිමි. |
| (iv) රැගෙන එන භාණ්ඩවල බර මැනීමට අදාල දත්ත ස්වයංක්‍රීයව රේගු පරිගණක පද්ධතියට (Asycuda) ඇතුළත් වන අයුරින් පරිගණක පද්ධතිය සංවර්ධනය කිරීම. | -එම- | මේ සම්බන්ධයෙන් එකඟ වන අතර වැඩිදුර අධ්‍යයනය කර ඉදිරියේදී අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |
| (v) රැගෙන එන භාණ්ඩවල වටිනාකම හා බර පිළිබඳ තොරතුරු සඳහා අදාල ගුවන් මගීන් පැමිණි ගුවන්තොටුපලවල් වෙතින් ලබා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම හා ඒ සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකස් කිරීම. | -එම- | මේ සම්බන්ධයෙන් එකඟ වන අතර වැඩිදුර අධ්‍යයනය කර ඉදිරියේදී අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |
| (vi) නිරන්තරයෙන් පැමිණීමේ පර්යන්තය භාවිතා කර වාණිජ ස්වරූපයේ භාණ්ඩ රැගෙන එන පුද්ගලයින් හඳුනාගැනීම හා ඔවුනට චේතනාන්විතව බදු වංචා කිරීමට හැකිවන සේ අදාල පාර්ශවයන්ට අයුතු ලෙස මුදල් ලබාදීම වැළැක්වීම සඳහා නීතිරීති සක්‍රීය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම. | -එම- | දෙපාර්තමේන්තු නියෝග අංක 700 හා 706 A මගින් පැනවූ නීති ප්‍රකාරව කටයුතු කරනු ලබන අතර නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් යලිත් ලබාදී ඇත. තවද අයථා ක්‍රියාවන්හි යෙදෙන නිලධාරීන් පිළිබඳව අදාළ විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (vii) වාණිජ ස්වරූපයේ භාණ්ඩ රැගෙන එන පුද්ගලයින් පිළිබඳ තොරතුරු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම. | -එම- | ඒ සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු වන අතර රේගු නිලධාරීන් විසින් දැනට පවත්නා නීතිරීති ප්‍රකාරව අදාළ කටයුතු සිදු කරනු ලබයි. |
| (viii) වාණිජ ස්වරූපයෙන් මගීන් සමඟ රැගෙන එන භාණ්ඩ පාලනය කිරීම සඳහා ගුවන් සේවා සමාගම සමඟ අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම. | -එම- | ශ්‍රී ලංකා රේගුවට අදාළ විෂය පථය තුළ ගුවන් මගියෙකු ගෙන එන භාණ්ඩ සඳහා පවතිනා නීතිරීති අනුකූලව බදු, දණ්ඩන කුලී අයකර ගනු ලැබේ. |
| (ix) නිලධාරීන් රාජකාරි ආරම්භ කිරමට පෙර ඔවුන් සතුව පවතින පෞද්ගලික මුදල් හා වෙනත් ඉහළ වටිනාකම් ඇති දෑ පිළිබඳව අනාවරණය කළ යුතු වීම. | -එම- | පිළිතුරු ලබා දී නොමැත. |

ඉහත සඳහන් පරිදි වූ බරපතල අභ්‍යන්තර පාලන දුර්වලතා නිසා පවතින පහත සඳහන් අවධානම් පිළිබඳව දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකරණයේ අවධානය යොමු කෙරේ.

- රජයේ බදු ආදායම නියමිත පරිදි අය නොවීම.
- නීති විරෝධි හා ආනයන සීමාකර ඇති භාණ්ඩ රට තුළට පැමිණීමේ අවධානමක් පැවතීම.

- මෙම භාණ්ඩ මිලදී ගැනීම සඳහා විදේශ රටවලට ප්‍රේෂණය වන විදේශ විනිමය වටිනාකම අනාවරණය නොවීම.
- නියමිත බදු ගෙවා භාණ්ඩ ආනයනය කරන ආනයනකරුවන්ට වෙළඳපල අවාසිදායක තත්ත්වයක් උද්ගත වීම වැනි රටට අහිතකර තත්ත්වයන් ඇති විය හැකි ලෙසට පරිසරය නිර්මාණය වී තිබුණි.

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාල ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | රාජ්‍ය ප්‍රතිපත්තිය සහ අදාල පනතට අනුකූලව කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව වගබලා ගත යුතුවීම. | පිළිතුරු ලබා දී නොමැත. |